ක්‍රිස්තුස් වහන්සේගේ

පෙර මග දූතයා

ශුද්ධ බයිබලය

"යේසුස් වහන්සේ ඔහුට කියනසේක්, මාර්ගයද, සැබෑවද, ජීවනයද, මමය...." (යොහාන් 14:6)

84 වන වෙළුම අංක 02 (980) 2025 මාර්තු / අප්‍රේල් මාස

ක්‍රිස්තුස් වහන්සේ මා තුළ ජීවත්වන සේක

ඇන්ඩ්‍රෑ මරේ විසිනි

දෙවියන් වහන්සේට උවමනා පරිදි ජීවත්වීමට ක්‍රිස්තුස් වහන්සේ අපට හැකියාව ලබාදෙන්නේ කෙසේද ? බොහෝ විට අපි ක්‍රිස්තුස් වහන්සේ ගැන සිතන්නේ අපෙන් වෙන්ව සිටින අපට සවන් දෙන සහ අපට උපකාර කරන පුද්ගලයෙකු ලෙසයි. කෙසේ වෙතත් මිදිවැල සහ අතු පිළිබඳ උපමාවේදී ක්‍රිස්තුස් වහන්සේ අප තුළ ජීවත්වන ස්වභාවය ගැන කථා කරයි. **"මිදිවැල මවය නුඹලා අතුය."** කියා යොහාන් 15:5 වන පදයේ සඳහන්වේ. මිදිවැල සහ අත්ත අතර ඇති එකමුතුවට වඩා සමීප හෝ සමීප විය හැකි කුමක්ද ? ක්‍රිස්තුස්වහන්සේ තුළ ඇති ජීවිතය සහ ආත්මය එලෙසින්ම අප තුළ තිබිය යුතුය.

මම අභ්‍යන්තරයේ වැඩ සිටින ගැලවුම්කරුවාණන් කෙරෙහි විශ්වාස කල යුතුය. ක්‍රිස්තුස් වහන්සේ ස්වර්ගයේ සිටින ආකාරයටම, අත්ත මිදිවැලේ පවතින්නාක් මෙන්ම මා තුළ සිටින බව දැනගත යුතුය. උන්වහන්සේ මගේ අභ්‍යන්තර ජීවිතයට පැමිණෙන සේක. උන්වහන්සේ තුළ ජීවත්වන විට මට දෙවියන් වහන්සේගේ දරුවෙකු ලෙස ජීවත්වීමට හැකියාව ලැබේ. උන්වහන්සේ මගේ කැමැත්ත, මගේ සිතුවිලි, මගේ හැඟීම් සහ ජීවිතය තුළට පැමිණ සර්වබලධාරී දෙවියන් වහන්සේට පමණක් ක්‍රියා කළ හැකි බලයෙන් මා තුළ ජීවත්වන සේක.

මම මෙය තේරුම් ගත්විට මාගේ ආත්මය දෙවියන් වහන්සේ කෙරෙහි නමස්කාරයෙන් හා විශ්වාසයෙන් වැඳ වැටෙයි. මම ශාරීරිකව ජීවත්වන්නේ මාංශයේ හා රුධිරයේ ජීවිතය තුළයි. නමුත් මා තුළ වාසය කරන ක්‍රිස්තුස් වහන්සේ මගේ සැබෑ ජීවිතයයි. ශුද්ධ ලියවිල්ලේ එය අලංකාරව පවසා ඇත. **"මම ක්‍රිස්තුස් වහන්සේ සමඟ කුරුසියෙහි ඇණගසනු ලැබ සිටිමි. එසේ වී නමුත් මම ජීවත්වෙමි. නුමුත් තවත් මා නොව ක්‍රිස්තුස් වහන්සේ මා තුළ ජීවත්වන සේක. තවද මා දැන් මාංසයෙහි ජීවත්වන ජීවිතය මට ප්‍රේම කළා වූ, මා උදෙසා තමන්ව පාවාදුන්නා වූ දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් වහන්සේ කෙරෙහි අදහිල්ලෙන් ජීවත්වෙමි."** (ගලාති 2:20)

එන්න, ජීවමාන ක්‍රිස්තුස් වහන්සේට ඔබ තුළ ජීවත්වමට ඉඩහරින්න. ඒ අරමුණින් ඔබ ඉදිරියෙහි තබා තිබෙන උන්වහන්සේගේ ආදර්ශය තුළ ජීවිතය දැන ගැනීමට උත්සාහ කරන්න. අපට ක්‍රිස්තුස් වහන්සේව අනුකරණය කිරීමට හැකි වන නිසා නොව නමුත් ක්‍රිස්තුස් වහන්සේ අප වෙනුවෙන් ජීවිතය ගත කළ නිසාත්, එය අපට ලබාදෙන නිසාත්, අපට උන්වහන්සේගේ ජීවිතය බෙදාගත හැකිය. ජීවමාන ක්‍රිස්තුස් වහන්සේට මගේ කැමැත්ත සහ ආශාවන් අයිති කර ගැනීමට මම ඉඩදුන්නොත් උන්වහන්සේ ගමන් කළ ආකාරයටම මටත් ගමන් කළ හැකිය.

දෙවියන් වහන්සේ මත යැපීම

ශුද්ධ ලියවිල්ලෙහි සඳහන් කර ඇති පරිදි ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතය දෙස හොඳින් බලන්න. උන්වහන්සේගේ ජීවිතයේ ශ්‍රේෂ්ඨතම සලකුණ නම්, උන්වහන්සේ ගැඹුරින්ම නිහතමානීව සහ ස්වර්ගීක පියාණන් වහන්සේ මත යැපෙමින් ජීවත් වූ බව ඔබට පෙනෙනු ඇත. උන්වහන්සේ පැවසුවේ, **"මට තනියම කිසිවක් කරන්ට නුපුළුවන. මම අසන පරිද්දෙන්ම විනිශ්චය කරමි. මාගේ විනිශ්චය ධර්මිෂ්ඨය. මක්නිසාද මාගේම කැමැත්ත නොව මා එවූ තැනැත්තාණන්සේගේ කැමැත්ත සොයමි."** (යොහාන් 5:30) සෑම දෙයකදීම උන්වහන්සේගේ ජීවිතය දෙවියන් වහන්සේගෙන් ලැබුණි.

ක්‍රිස්තුස් වහන්සේගේ පොළොවේ සේවය ආරම්භයේ සිට අවසානය දක්වා සියල්ල උන්වහන්සේගේ පියාණන් වහන්සේ මත කළ සේක. මා තුළ ජීවත්වීමට යන ක්‍රිස්තුස් වහන්සේ සෑම දෙයකින්ම දෙවියන් වහන්සේට ගෞරව කළ ක්‍රිස්තුස් වහන්සේ බව මම තේරුම් ගන්නේ නම්, උන්වහන්සේ මා තුළ එම ආකල්පයම ක්‍රියාත්මක කරන සේක. උන්වහන්සේ සෑමවිටම ඒත්තුග නු ලැබුවේ උන්වහන්සේගේ ජීවිතය දෙවියන් වහන්සේගෙන් ලැබුණු බවයි. යේසුස් වහන්සේ මෙසේ පවැසූ සේක. **"පියාණන් වහන්සේ පුත්‍රයාණන්ට ප්‍රේම කරන සේක. සියල්ල උන්වහන්සේ අතට භාරදී තිබේ."** (යොහාන් 3:35) උන්වහන්සේ නැවතත් මෙසේ පැවසූ සේක. **"මක්නිසාද පියාණන් වහන්සේ තමන් තුළම ජීවනය ඇතුව සිටින්නාක් මෙන් පුත්‍රයාටත් තමන් තුළම ජීවනය ඇතුව සිටින්ට උන්වහන්සේ වරය දුන් සේක."** (යොහාන් 5:26) ඒ ක්‍රිස්තුස් වහන්සේගේ ආරම්භක ස්ථානයයි. මාගේ ජීවිතය දෙවියන් වහන්සේගෙන් පැමිණේ. මම දෙවියන් වහන්සේගෙන් පැමිණෙමි. මට මා විසින්ම කරන ලද කිසිවක් නැත. මට ලැබෙන සියල්ල දෙවියන් වහන්සේගෙන් ලැබිය යුතුය.

ක්‍රිස්තුස් වහන්සේ එම ස්ථාවරය ගත්තා නම් අපිත් එසේ කළ යුතුය. මේ නව ජීවිතය මට දෙවියන් වහන්සේගෙන් ලැබුණු ජීවිතයකි. උන්වහන්සේ එය මට ලබාදුන් සේක. මගේ හදවතේ දෙවියන් වහන්සේගේ ක්‍රියාවන් පවතින්නේය. ශුද්ධාත්මයාණන් වහන්සේගේ නව උත්පාදනය කරුණාකොටගෙන මට දෙවියන් වහන්සේගෙන් නව ජීවිතයක් ලැබී තිබෙනවා යැයි අපි ගැඹුරු සත්‍යතාවයකින් කිව යුතුය. දෙවියන් වහන්සේ දී අති ජීවිතය ගැන කුමක් කිව හැකිද ? එය නඩත්තු කරන්නේ කවුද ? දෙවියන් වහන්සේට පමණක් උන්වහන්සේ ආරම්භ කළ දේ පවත්වාගත හැකිය. උන්වහන්සේ එය සම්පූර්ණ කිරීම සඳහා ක්‍රියා කරන සේක.

ඕනම කිතුණුවෙකුගේ ජීවිතයේ ඉහළම ගුණාංගය නම් දෙවියන් වහන්සේට උන්වහන්සේගේ මාර්ගය පෙන්වීමට ඉඩ ලබාදීමයි. දෙවියන් වහන්සේට අප තුල උන්වහන්සේගේ කාර්යය කිරීමට අපි උන්වහන්සේට අවස්ථාව ලබාදිය යුතුය. අපි දිනෙන් දින පැයෙන් පැය දෙවියන් වහන්සේ මත සම්පූර්ණයෙන්ම යැපෙන ස්ථානයට පැමිණිය යුතුය. අපි එක් පාඩමක් ඉගෙනගත යුතුයි. එනම් දෙවියන් වහන්ස මට කිසිවක් නැත. මම කිසිවක් නොදනිමි. මම කිසිවක් නොවේ. දෙවියන් වහන්සේ මට කිරීමට හැකියාව ලබාදෙන දේ පමණක් මට කළ හැකිය.

ක්‍රිස්තුස් වහන්සේ මාව දෙවියන් වහන්සේට ළං කරන්නේ කෙසේද ? උන්වහන්සේම පැමිණි ආකාරයෙන් හැර වෙනත් ආකාරයකින් උන්වහන්සේට මාව දෙවියන් වහන්සේ වෙතට ළංකල නොහැකිය. ඒ ක්‍රමය කුමක්ද ? එය තමාවම අත්හැරීමේ මාර්ගයයි. දෙවියන් වහන්සේට සම්පූර්ණයෙන්ම යටත්වීමේ මාර්ගයයි. උන්වහන්සේ සදාකල්හීම පියාණන් වහන්සේ තමන්වහන්සේ තුළ ක්‍රියා කරනු ඇතැයි අපේක්ෂා කළ සේක. උන්වහන්සේ ශක්තිය උදෙසා දෙවියන් වහන්සේ දෙස බැලූසේක. මඟනේවීම ලබා ගැනීම සඳහා පියාණන් වහන්සේට යාච්ඤා කළ සේක. උන්වහන්සේ කරදරයේ දී දෙවියන්වහන්සේට මොරගැසූ සේක. යේසුස් වහන්සේට සියල්ල පියාණන් වහන්සේ වූ සේක. ක්‍රිස්තුස් වහන්සේ වෙන කිසිවක් තුළ ප්‍රීතියට පත්නොවූ සේක. අප තුළ ක්‍රිස්තුස් වහන්සේගේ බලය දැන ගැනීමට නම් සම්පූර්ණයෙන්ම දෙවියන් වහන්සේ මත යැපෙන ජීවිතයක් අවශ්‍ය බව අපට උගන්වන ලෙස දෙවියන් වහන්සේට යාච්ඤා කරන්න.

ක්‍රිස්තුස් වහන්සේගේ මරණය තුල එක්සත්වීම

දෙවියන් වහන්සේ කෙරෙහි අපගේ යැපීම පිළිබඳව ක්‍රිස්තුස් වහන්සේගේ මරණය අපට උගන්වන්නේ කුමක්ද ? දෙවියන් වහන්සේ

2 පිටුවට

1 පිටුවෙන්

ක්‍රිස්තුස් වහන්සේ මා තුළ ...

තම පුත්‍රයාණන්ට දුන් ජීවිතය උන්වහන්සේ සම්පූර්ණයෙන්ම දෙවියන් වහන්සේට භාරදුන් බව එයින් අපට පෙනෙන්නේය. යේසුස් වහන්සේ උන්වහන්සේගේ ජීවිතය තමන්වහන්සේගේ ලෙස නොසැලකුසේක. පියාණන් වහන්සේට අවශ්‍ය නම් කොයිතරම් දුක්විඳීමක් වුවත්, කොයිතරම් ලැජ්ජාවක් වුවත්, මරණයේ දුක්විඳීම කොයිතරම් වේදනාකාරී වුවත් උන්වහන්සේට වුවමනා ආකාරයට එය දරා ගැනීමට යේසුස් වහන්සේ ඉඩ දුන් සේක. එය නිවැරදිය. මක්නිසාද මා සතුව ඇති සියල්ල උන්වහන්සේගේ නම් ඒ සියල්ල උන්වහන්සේට වුවමනා ආකාරයට සිදුවිය යුතුය. යේසුස් වහන්සේට වයස අවුරුදු දොළහක් වූ විට උන්වහන්සේ තම මව්චු මරියාට මෙසේ පැවසූ බව මතක තබාගන්න. **"එවිට උන්වහන්සේ නුඹලා මා සෙවිවේ මක්නිසාද ? මාගේ පියාණන් වහන්සේගේ ගෘහයේ මා සිටින්නට ඕනෑ බව නුඹලා දැන සිටියේ නැද්දැයි ඔවුන්ට කී සේක."** (ලූක් 2:49) පසුව උන්වහන්සේ මෙලෙසින් ද පැවසූ සේක. **"මක්නිසාද මා ස්වර්ගයෙන් බැස ආවේ මාගේ කැමැත්ත නොව මා එවූ තැනැත්වහන්සේගේ කැමැත්ත කරන පිණිසය."** (යොහාන් 6:38) ගෙත්සෙමනේදී උන්වහන්සේගේ මරණයට පෙර එම අවසාන පැය කිහිපය තුළ උන්වහන්සේ පියාණන් වහන්සේට මෙලෙසින් පැවසූ සේක. **"පියාණෙනි, ඔබ කැමති සේක් නම් වේ කුසලාන මාගෙන් පහකල මැනව, එසේවී නමුත් මාගේ කැමැත්ත නොව ඔබගේ කැමැත්ත වේවායි කී සේක."** (ලූක් 22:42) ඇදහිලිවන්තයන් ලෙස දෙවියන් වහන්සේට අප ගැන ඇති අයිතිය අප කිසිවිටෙකත් පිළිගෙන නැත. මගේ මුළු ජීවිතයම උන්වහන්සේගෙන් පැමිණේ. මගේ ජීවිතයේ සෑම මොහොතක්ම ආපසු උන්වහන්සේට භාරදිය යුතුය. අධ්‍යාත්මික ජීවිතයේ මට ලැබෙන සෑම ශක්තියක්ම දෙවියන් වහන්සේගෙන් ලැබෙන අතර සෑම ක්‍රියාවකම මහිමය දෙවියන් වහන්සේට හිමිවන පරිදි ක්‍රියා කළ යුතුය.

ක්‍රිස්තුස් වහන්සේව තමන් තුළ තබාගෙන සිටින කිතුණුවෙක් සැබවින්ම පවිත්‍රය. ඔහු සම්පූර්ණයෙන්ම දෙවියන් වහන්සේට කැපවූ පුද්ගලයෙකි. එය පහසු කාර්යයක් නොවේ. මක්නිසාද තමන්ගේ කැමැත්ත ඉතා ශක්තිමත්ව පවතියි. පාපය අපව බියජනක තත්ත්වයකට ගෙනැවිත් තිබේ. දෙවියන් වහන්සේගේ කැමැත්ත කිරීම ගෞරවයක් සහ වරප්‍රසාදක් ලෙස සලකනවා වෙනුවට අපි එය දුෂ්කර දෙයක් ලෙස සලකන්නෙමු. එහෙත් පුද්ගලයෙක් තමාව අතහැර දෙවියන්වහන්සේට යටත් වුවහොත් ඔහුට තමා තුළ ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතය අත්විඳිය හැකිය.

ක්‍රිස්තුස් වහන්සේ අපට දන්වා සිටින්නේ මා ඔබ තුළ ජීවත්වීමට අවශ්‍යය නම් මා කළ දේ ඔබ කළ යුතුය. ඔබේම ජීවිතය මරණය දක්වාම, කුරුසියේ මරණය දක්වාම කුරුසියේ ඇණ ගැසීමට භාරදිය යුතුය. අපි ක්‍රිස්තුස් වහන්සේගේ මරණයේ සැබෑ පංගුකාරයන් විය යුතුය. මේ අනුව දෙවියන් වහන්සේගේ වචනයේ පවසන්නේ, **"මක්නිසාද උන්වහන්සේගේ මරණයේ සමානත්වයෙන් අපි උන්වහන්සේට සම්බන්ධවී සිටිමු නම්, උන්වහන්සේගේ නැගිටීමේ සමානත්වයෙනුත් සම්බන්ධ වන්නෙමුව."** (රෝම 6:5) එම නිසා කිතුණුවෙකු ලෙස මම මෙලෙස පැවසිය යුතුය. මම මගේ මමත්වයට මරණයට පත්වී ක්‍රිස්තුස් වහන්සේ උන්වහන්සේගේ මරණය කරුණුකොටගෙන මා තුළට පැමිණ මා තුළ උන්වහන්සේ ජීවත්වන පිණිස උන්වහන්සේ වෙතට ගෙන යන්නෙමි.

නැවත නැගිටීමේ ජීවිතය

ඊළඟ පියවර වන්නේ නැවත නැගිටීමයි. ක්‍රිස්තුස් වහන්සේ තම ජීවිතය පූජා කළ විට දෙවියන් වහන්සේ එය බොහෝ තේජසින් යුතුව උන්වහන්සේට එය නැවත ලබා දුන් සේක. ක්‍රිස්තුස් වහන්සේ සොහොනට බැස ගිය පසු දෙවියන් වහන්සේ උන්වහන්සේව ඔසවා උන්වහන්සේට තිබූ ජීවිතයට වඩා සීමා කළ නොහැකි උසස් සහ යහපත් නව ජීවිතයක් ලබා දුන් සේක.

ක්‍රිස්තුස් වහන්සේගේ නැවත නැගිටීම මෙය මට උගන්වයි. මගේ නපුරු ජීවිතය, මගේ නපුරු කැමැත්ත, මගේ හදවත සහ එහි ආශාවන්, මේ ලෝකයේ මගේ සියලු බලය යන සියලු දේ දෙවියන් වහන්සේට බාරදීමට මම කැමති නම් ක්‍රිස්තුස් වහන්සේගේ නැවත නැගිටීමේ ජීවිතය මගේ හදවත තුළට ලබාදෙන සේක. මළවුන්ගෙන් නැගිට්ටා වූ ජීවමාන ක්‍රිස්තුස් වහන්සේ පැමිණ මාගේ හදවතේ ජීවත්වන සේක.

යේසුස් වහන්සේගේ සොහොන්ගෙය අධ්‍යයනය කරන්න. එයින් අදහස් කරන්නේ කුමක්ද ? කිසිඳු උපකාරයක් (පිළිසරණක්) නැතිව උන්වහන්සේ මරණයට පත්වූසේක. උන්වහන්සේ සොහොන් ගෙයි තැන්පත් කරනු ලැබ දෙවියන් වහනසේට තම කාර්යය කිරීමට කාලය ගැනීමට ඉඩහැරිය සේක. දෙවියන් වහන්සේ කළේ කුමක්ද ? උන්වහ්නසේ පොරොන්දුව ඉටු කළ අතර කල්වාරියට පෙර උන්වහන්සේගේ ජීවිතයට වඩා දහස් ගුණයකින් තේජාන්විත ජීවිතයක් උන්වහන්සේට ලබා දුන් සේක. ක්‍රිස්තුස් වහන්සේ සැබවින්ම ඔබගේ හදවතේ ජීවත්වීමට ඔබට අවශ්‍ය නම් සොහොනට බැස ගිය ක්‍රිස්තුස් වහන්සේව ඔබට අවශ්‍ය වන්නේය. කුරුසියේ මරණයට පත්වී සදාකාලයටම ජීවමානව සිටින ක්‍රිස්තුස් වහන්සේ පැමිණ, මා තුළ උන්වහන්සේගේ මරණයේ බලය තබන සේක. එවිට සියල්ල ස්වභාවිකවම පාපයට මරණයට පත්වන අතර, උන්වහන්සේගේ ජීවනයේ බලය ගෙන එන්නේය. එයින් මා තුළ ඇති සියල්ලට දෙවියන් වහන්සේගේ නව ජීවනය ඇතිව ජීවත්වීමට හැකිවන්නේය. යේසුස් වහන්සේ අප තුළට පැමිණීම පිළිබඳව හුදෙක් සිතුවිලි වලින් සෑහීමට පත්නොවන්න. උන්වහන්සේගේ පැමිණීම සැබවින්ම සිදුවේවා. උන්වහන්සේ අප තුළ ජීවමානව වාසය කරන සේක්වා.

සම්පූර්ණ ජීවිතය

යේසුස් වහන්සේ නැවත නැගිටුණු පසු උන්වහන්සේ ස්වර්යට ඔසවාගනු ලැබූ සේක. දෙවියන්වහන්සේ උන්වහන්සේගේ බලයේ ස්ථානයට ඔසවාගනු ලැබුවේ මහිමයේ සිංහාසනය බෙදාගැනීමට උන්වහන්සේව බලයේ කොටස්කරුවෙකු බවට පත්කරමින් වන සේක. උන්වහන්සේ ශුද්ධාත්මයාණන් වහන්සේව එවූ සේක.

මම මාගේ සෙනඟට ආශීර්වාදයක් වන්නේ කෙසේද කියා බොහෝ දෙනෙක් අසති. ක්‍රිස්තුස් වහන්සේ ලෝකයට ආශීර්වාදයක් වූයේ කෙසේද ? උන්වහන්සේ දෙවියන් වහන්සේට තමන්වහන්සේම භාරවී තම කැමැත්තට සහ තමන්ගේම ස්වභාවික ජීවිතයට මිය ගොස් දෙවියන් වහන්සේව නැගිටුවන තෙක් බලා සිටි සේක.

දේවස්ථානය කැළඹීමට ලක්කරන විශාලම ප්‍රශ්නය නම් කිතුණුවන් මෙතරම් දුර්වල වන්නේ ඇයි කියාය. බොහෝදෙනාට ඇති විශාලම ප්‍රශ්නය නම් දෙවියන් වහන්සේ පොරොන්දු වන පරිදි ජීවත්වීමට සම්පූර්ණ කිතුණු ජීවිතයක් ලබාගත හැකිද යන්නයි. පියාණන් වහන්සේට අපව මිදිවැලේ අතු බවට පත්කිරීමට හැකිවන පරිදි දෙවියන් වහන්සේගේ දරුවන්වීමට අපට කුමක් කළ හැකිද යන්නයි. අප කළ යුත්තේ කුමක්ද ? පළමුව අපි ක්‍රිස්තුස් වහන්සේ දෙස බලා අපෙන්ම මෙසේ අසාගත යුතුයි. ක්‍රිස්තුස් වහන්සේට මා තුළ ජීවත්වීමට හැකි වන පරිදි සියල්ල අත්හැරීමට මම කැමතිද ? ඔව් ස්වාමීනි, ක්‍රිස්තුස් වහන්සේව උරුමකරගන්නා පිණිස ඕනෑම දෙයක් අත්හරින්නෙමි කියා කී දෙනෙක් කියයිද ?

මට ගැලවීම ලැබී ඇත. මම ක්‍රිස්තුස් වහන්සේගෙන් ස්වල්පයක් ලබා ඇත්තෙමි. මම මාගේ උපරිමයෙන් කරමි. යන අර්ධ කිතුණු ජීවිතයකින් තවදුරටත් සෑහීමට පත්නොවන්න. දෙවියන් වහන්සේ පිරිනමන සම්පූර්ණ ජීවිතයට පැමිණෙන්න. ක්‍රිස්තුස් වහන්සේ මගේ ජීවිතය සම්පූර්ණයෙන්ම හිමිකරගන්නා සේක්වා. ක්‍රිස්තුස් වහන්සේ තුළ නිහතමානී තැනැත්තා, කීකරු තැනැත්තා, දුකිවිඳින තැනැත්තා, මිය යන තැනැත්තා සහ දෙවියන් වහන්සේ මත යැපෙමින් ජීවත්වන තැනැත්තා තුළට පැමිණෙන බැවින් ක්‍රිස්තුස් වහන්සේ මා තුළ ජීවත් වුවහෙත් එය මාගේ ජීවිතය වනු ඇත කියා පවසන්න.

ක්‍රිස්තුස් වහන්සේ අපගේ ජීවිතයයි

පෙරමඟ දූතයා මෙම කලාපය ඔබගේ ජීවිතය වෙනස් කළ හැකිය. එය හරියටම සත්‍යය නොවේ. මෙම ලිපිය ඔබගේ ජීවිතය වෙනස් කළ හැකිය. එයත් හරියටම සත්‍යය නොවේ. ස්වාමීන් වහන්සේ වන යේසුස් ක්‍රිස්තුස් වහන්සේ මෙම පණිවිඩවල කේන්ද්‍රය වී ඇති නිසා උන්වහන්සේට ඔබගේ ජීවිතය වෙනස් කළ හැකිය යන්න නියත වශයෙන්ම සත්‍යයතාවයයි. ඔබගේ ජීවිතයේ තත්ත්වය කුමක් වුවත් යේසුස් වහන්සේට ඔබව එහිදී මුණගැසී ඔබගේ ජීවිතය තුළ හා ඒ හරහා ආශ්චර්‍යමත් දේ කළ හැකිය. දුෂ්කර කාලයන්වලදී පවා විශේෂයෙන් අපගේ විශ්වාසය සහ බලාපොරොත්තුව උන්වහන්සේ කෙරෙහි තැබිය හැකිවන්නේ ඇයි යන්නට හේතු කිහිපයක් අපි එක්ව සලකා බලමු.

1. උන්වහන්සේගේ පුද්ගලිකත්වය, උන්වහන්සේගේ ක්‍රියාව සහ උන්වහන්සේගේ සම්පත් සියල්ල ආවරණය කරයි.

අපගේ ස්වාමීන් වන යේසුස් වහන්සේගේ මහිමය, චරිතය, ස්වභාවය, දේවසේවය සහ හැකියාව අපට සම්පූර්ණයෙන්ම ග්‍රහණය කරගත නොහැකි තරම්ය. කෙසේ වෙතත් බයිබලයේ සහ ඇදහිලිවන්තයන් ලෙස අපගේ අත්දැකීම්වලදී උන්වහන්සේ කොයිතරම් විශ්මය ජනක හැකියාවකින් පූර්ණද කියා අපූරු අදහසක් අපට ලබාදෙයි. උදාහරණයක් වශයෙන් උන්වහන්සේ අල්ෆා සහ ඔමේගාය. ආරම්භය සහ

රිචි කාර්මයිකල් විසිනි

අවසානයයි. (එළිදරව් 1:8) ජීවනදායක ආහාරයයි (යොහාන් 6:35) අපගේ ගැලවීමේ නායකයාය (හෙබ්‍රෙව් 2:10) ගැලවුම්කරුවාණෝය. (රෝම 11:26) සදාකාල පියාණෝය. (යෙසායා 9:6) පළමුවෙනියා සහ අන්තිමයාය (එළිදරව් 1:17) යහපත් එඩෙරාය (යොහාන් 10:11) සභාවේ ප්‍රධානියාය (එපීස 1:22) අබ්‍රහම්ට පළමුවෙන් මම සිටියෙමි (යොහාන් 8:58) යේසුස් යන නාමය ලැබුවාය. (මතෙව් 1:21) රජවරුන්ගේ රජ සහ ස්වාමිවරුන්ගේ ස්වාමියයා (1 තිමෝති (6:15) ලෝකයේ ආලෝකයයි (යොහාන් 8:12) සියල්ලන්ගේ ස්වාමියාය (ක්‍රියා 10:36) බලවත් දෙවියන්

3 පිටුවට

"යේසුස් වහන්සේ ඔවුන්ට කියනසේක් ..... , ජීවනදායක කෑම නම් මමය...." (යොහාන් 6:35)

2පිටුවෙන්

ක්‍රිස්තුස් වහන්සේ අපගේ...

රිව් කාර්මයිකල් විසිනි

වහන්සේය. (යෙසායා 9:6) සමාදානයේ කුමාරාය (යොසායා 9:6) නැවත නැගිටීම හා ජීවනයයි. (යොහාන් 11:25) පර්වතයයි (1 කොරින්ති 10:4) ගැලවුම්කරුවාය. (ලූක් 2:11) දෙවියන් වහන්සේගේ පුත්‍රයයා. (මතෙව් 2:15) සැබෑ මිදිවැලයි (යොහාන් 15:1) සහ දෙවියන් වහන්සේගේ වචනයයි. (එළිදරව් 19:13)

ඇත්ත වශයෙන්ම ක්‍රිස්තුස් වහන්සේගේ තවත් බොහෝ නම් සහ විස්තර ලැයිස්තු ගත කළ හැකිය. නමුත් මේ ස්වල්පයෙන් පවා උන්වහන්සේගේ බලය සහ මහිමය ප්‍රකාශ කරති. උන්වහන්සේ කවුද සහ උන්වහන්සේට කළ හැකි දේට එහායින් ගිය කිසිවක් නැත. උන්වහන්සේ තුළ ගැලවීම, සාමය, සමාවදීම, ප්‍රීතිය, සුවකිරීම, සැපයීම, ආරක්ෂාව, ප්‍රඥාව, දිරිගැන්වීම, සැනසීම, ශක්තිය, බලය ඇත. ලැයිස්තුව දින නියමයක් නැතුව ඉදිරියට ගෙනයා හැකිය. මාගේ දෙවියන් වහන්සේ ක්‍රිස්තුස් යේසුස් වහන්සේ තුළ තමන්ගේ තේජස් සම්පතේ ප්‍රකාරයට නුඹලාගේ සියලු හිඟකම් සම්පූර්ණ කරන සේක. (පිලිප්පි 4:19)

2. උන්වහන්සේ සෑමවිටම අප සමඟ සිටින බවට පොරොන්දු වන අතර අවසානයේ උන්වහන්සේ අප තුළ වාසය කරන සේක.

මෙම සත්‍යය මතකයේ තබාගෙන ඉහත සඳහන් නම් සහ විස්තරය නැවත කියවන්න. මේ අප සමඟ හා අප තුළ සිටින ක්‍රිස්තුස් වහන්සේය. ඇදහිය නොහැකි උන්වහන්සේගේ පැමිණීම, බලය, ප්‍රේමය, ජීවිතය, කරුණාව සමඟ නැවතත් ලැයිස්තුව දිගින් දිගටම පවතී. උන්වහන්සේ අප තුළ ක්‍රියාත්මක වන විට ඕනෑම දෙයක් ජය ගැනීමට සහ උන්වහන්සේගේ අරමුණට අනුව ඕනෑම දෙයක් ඉටුකිරීමට හැකිය. **"මා බලවත් කරන්නා වූ තැනැත්වහන්සේ තුළ මට සියලු දේ කරන්ට පුළුවන."** (පිලිප්පි 4:13) උන්වහන්සේම පවසා ඇත්තේ මම කිසිදාක නුඹව අත්නාරිමි කියාය. එබැවින් අපට නිර්භීතව මෙසේ පැවසිය හැකිය. **"වෙසේ ස්වාමීන් වහන්සේ මාගේ උපකාරකයාණෝය. මම බයනොවන්නෙමි., මනුෂ්‍යයා මට කරන්නේ කුමක්ද කියා මහත් ධෛර්‍යයෙන් යුක්තව කියමුව."** (හෙබ්‍රෙව් 13:6)

3. උන්වහන්සේ අප උදෙසා වන සේක

යේසුස් වහන්සේ අපව මැවූ තැනත්වහන්සේ පමණක් නොව උන්වහන්සේගේ අනර්ඝ වූ ලේවලින් අපව මුදාගන්නා වූ තැනත්වහන්සේ ද වන සේක. අපි උන්වහන්සේට අයිති වන්නෙමු. උන්වහන්සේ අපව සම්පූර්ණයෙන්ම දන්නා අතර උන්වහන්සේගේ ජීවිතය සහ ජයග්‍රහණය අප සමඟ බෙදා ගැනීමට බලා සිටින සේක. අප මුහණදෙන පරීක්ෂාවන් ගැන උන්වහන්සේ සියල්ල දන්නා අතර ඒවා අපගේ ජීවිතවල යහපතක් කරනු දැකීම උන්වහන්සේට අවශ්‍ය වන සේක. තවද උන්වහන්සේ අපට උපකාර කරන සේක. අපව රැකබලා ගනිමින් අපව ගෙනයන සේක. උන්වහන්සේ අපගේ දුර්වලකම් ගැන අනුකම්පා කරන අපව සම්පූර්ණයෙන්ම ගලවා ගැනීමට සමත් දයාවන්ත හා විශ්වාසවන්ත උත්තම පූජකයාණෝය. මක්නිසාද උන්වහන්සේ සැමවිටම අප වෙනුවෙන් මැදිහත්වීමට ජීවමානව සිටින සේක. (හෙබ්‍රෙව් 2:17, 4:15, 7:25)

උන්වහන්සේ අප කෙරෙහි ඇති ප්‍රේමයේ පළල, දිග, ගැඹුර, උස අපට තේරුම් ගැනීමට හැකිවේවා. **"දෙවියන් වහන්සේගේ වුළු පූර්ණකමට පූර්ණවන පිණිස සියලු ශුද්ධවන්තයන් සමඟ ක්‍රිස්තුස් වහන්සේගේ දැනගත නොහැකි ප්‍රේමය දැනගෙන එහි පළල, දිග, උස, ගැඹුර කිමෙක්ද කියා තේරුම්ගන්නට නුඹලාට පුළුවන් වන පිණිසත්, උන්වහන්සේගේ මහිමයේ සම්පතේ හැටියට නුඹලාට දෙන මෙන් යාච්ඤා කරමි."** (එපීස 3 :18-19) මුහුණදෙන අභියෝගය කුමක් වුවත් කමක් නැත. **"නුමුත් අපට ප්‍රේම කළා වූ තැනැත්වහන්සේ කරුණාකොටගෙන අපි වේ සියල්ලේදී අතිශයින්ම ජයගන්නෝවමුව. මක්නිසාද මරණයටවත්, ජීවනයටවත්, දූතයන්ටවත්, අධිපතිකම්වලටවත්, දැන් පවතින දේවලටවත්, මතු පැමිණෙන දේවලටවත්, පරාක්‍රමවලටවත්, උසටවත්, ගැඹුරටවත් අන්කිසි මැවිල්ලකටවත්, අපගේ ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ තුළ ඇත්තා වූ දෙවියන් වහන්සේගේ ප්‍රේමයෙන් අප වෙන්කරන්ට නොහැකිවන්නේ යයි ඒකාන්තයෙන්ම දනිමි."** (රෝම 8:37-39)

4. ක්‍රිස්තුස් වහන්සේ මරණයට පත්වී නැවත නැගිට සිටින නිසා අපට පාපයට සහ තමකමට මිය යා හැකි අතර අලුත් ජීවියක් ගත කළ හැකිවේ.

අපි එය ලබාගෙන ඇදහිල්ලෙන් අපගේ ජීවිත තුළ ක්‍රියාත්මකවීමට ඉඩ දුන් පසු එය ජීවිතය වෙනස් කරන ගැඹුරු සත්‍යතාවයකි. ක්‍රිස්තුස් වහන්සේ අපගේ අධ්‍යාත්මික ජීවිතයට යතුරයි. එසේ නැතිනම් ක්‍රිස්තුස් වහන්සේ අපගේ ජීවනයයි. (කොලොස්සි 3:4) උන්වහන්සේ මාර්ගය, සැබෑව, ජීවනය වන සේක. (යොහාන් 14:6) අපගේ ශක්තියෙන් අපට කිසිවිටෙකත් පාපයට සහ තමකමට මිය යාමට නොහැකිය. නුමුත් ක්‍රිස්තුස් වහන්සේ සමඟ උන්වහන්සේගේ මරණයේ ස්වරූපයෙන් එක්සත් වූ විට, (රෝම 6:5) සැබවින්ම පාපයට සහ තමකමට මරණයට පත්විය හැකිය. **" මක්නිසාද ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රේමය අප කෙරෙහි බලපවත්වන්නේය. එසේය, එක්කෙනෙක් සියල්ලන් වෙනුවට මැරුණේය කියාත්, එබැවින් සියල්ලෝම මැරුණෝය කියාත්, උන්වහන්සේ සියල්ලන් වෙනුවට මැරුණේ, ජීවත්වන්නන් තවත් තමුන් උදෙසා ජීවත් නොවී, ඔවුන් වෙනුවට මැරී නැවත නැගිටුණාවූ තැනැත්වහන්සේ උදෙසා ජීවත්වන පිණිසය කියාත්, අපි නිශ්චයකොට කියමුව. එහෙයින් මෙතැන් පටන් අපි මාංසාකාරයෙන් කිසවෙකු දැන නොගනිමුව. මාංසාකාරයෙන් ක්‍රිස්තුස් වහන්සේ දැනගෙන සිටිය නමුත් අපි දැන් තවත් එසේ දැන නොගනිමුව. එබැවින් යමෙක් ක්‍රිස්තුස් වහන්සේ තුළ සිටින්නේ නම් ඔහු අළුත් මැවිල්ලකය. පරණ දේ පහව ගියේය. මෙන්න සියල්ලම අළුත්වී තිබේ."** (2 කොරින්ති 5 : 14-17) **" අප පාපවලට නැසී ධර්මිෂ්ඨකමට ජීවත් වන පිණිස, උන්වහන්සේගේ තුවාල වලින් නුඹලා සුවකරනු ලැබුවහුය. මක්නිසාද නුඹලා බැටළුවන් මෙන් මුලාවයවින් සිටියහුය. නුමුත් දැන් නුඹලාගේ ආත්මවල එඬේරාද, රැකවලාද වෙතට හැරී ඇවිත් සිටින්නහුය. "** (1 ප්‍රේතුස් 2 : 24-25)

අපගේ ප්‍රතිචාරය

එවැනි අපූරු සත්‍යතාවයක් දෙස බලනවිට අපගේ ප්‍රතිචාරය කෙබඳු විය යුතුද ? උන්වහන්සේ අපගේ ජීවිතයවීමට ඉඩනොදිය යුතුද ? අපි සියල්ල උන්වහන්සේට භාරදී අපගේ ජීවිතවල සම්පූර්ණ පාලනය උන්වහන්සේට දිය යුතු නොවේද ? උන්වහන්සේගේ පුද්ගලික මහිමයෙන්, උන්වහන්සේගේ ස්වභාවයෙන්, උන්වහන්සේගේ චරිතයෙන්, උන්වහන්සේගේ බලයෙන්, උන්වහන්සේගේ ජීවිතයෙන්, උන්වහන්සේගේ ප්‍රේමයෙන්, උන්වහන්සේගේ සමාදානයෙන්, උන්වහන්සේගේ ධර්මිෂ්ඨකමෙන්, උන්වහන්සේගේ ප්‍රීතියෙන්, උන්වහන්සේගෙන් අපව පුරවන ලෙස ඉල්ලා සිටිය යුතු නොවේද ? යොහාන් බෞතීස්ත මෙන් ක්‍රිස්තුස් වහන්සේ වැඩිවීමටත් අපි අඩුවීමටත් ආශා කළ යුතුය. (යොහාන් 3:30) ඇත්ත වශයෙන්ම මෙය කිරීමට නම් අපි පාපයට සහ මමත්වයට මරණයට පත්විය යුතුය. අපි ක්‍රිස්තුස් වහන්සේ සමඟ කුරුසියේ ඇණගසනු ලැබිය යුතු අතර, තවදුරටත් අපගේම ජීවිතය ගතනොකළ යුතුය. (ගලාති 2:20) මෙය ප්‍රතිවිරුද්ධ සත්‍යතාවයකි. නමුත් අපි සැබවින්ම ජීවත්වීමට පටන්ගන්නා වූ ආකාරය නම් අපගේම ජීවිතය අතහැර ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතය ලබා ගැනීමයි. යේසුස් වහන්සේ මෙසේ පැවසූ සේක. **"එවිට යේසුස් වහන්සේ ගෝලයන්ට කථාකොට යමෙක් මා පස්සේ එන්ට කැමති නම් ඔහු තමාම නොසලකා, තමාගේ කුරුසිය රැගෙන මා අනුව එවා. මක්නිසාද යමෙක් තමාගේ ජීවිතය ගලවාගන්නට කැමතිවේද, ඒක ඔහුට නැතිවන්නේය. මා නිසා තමාගේ ජීවිතය නැතිවෙන අයට ඒක සම්බවන්නේය."** (මතෙව් 16 : 24-25)

පෙරමඟ දූතයා මෙම කලාපයේ අනෙකුත් ලිපිවල මේ පිළිබඳව වඩාත් විස්තරාත්මකව සාකච්ඡා කරන අතර මම ඒවාට ආමේන් (එසේම වේවා) කියමින් ඔබගේ ජීවිතය ක්‍රිස්තුස් වහන්සේට සම්පූර්ණයෙන්ම බාරදෙන ලෙස මම ඔබව ධෛර්‍යමත් කරමි. උන්වහන්සේගේ මරණය කරුණාකොටගෙන, උන්වහන්සේ සමඟ එක්සත්වී ඔබගේ ජීවිතයේ ඕනෑම පාපයක්, ඕනෑම සමාවනොදීමක්, අපිරිසිදුකමක්, බොරුවක්, කුහකකමක්, කෝපයක් හෝ මාංසයේ වෙනත් ඕනෑම ක්‍රියාවක් මරණයට පත්කිරීමට උන්වහන්සේට ඉඩදෙන්න. උන්වහන්සේගේ මරණය සමඟ පංගුකාරවීමෙන් ඔබගේ ජීවිතයේ ඕනෑම ආත්මාර්ථකාමී ස්වභාවයක්, තම ධර්මිෂ්ඨකමත්, තම ශක්තිය මත රැඳී සිටීමත්, තමාවම සාධාරණය කරගැනීමත් ඇතුළු තමා මත රැඳ සිටීම මරණයට පත්කරන්න. නැවතත් ක්‍රිස්තුස් වහ්නසේගේ ආධිපත්‍යයට ඉඩදෙන්න. උන්වහන්සේ ඔබේ ජීවිතය සම්පූර්ණයෙන්ම පුරවා ඔබ තුළ වාසය කිරීමට ඉඩදෙන්න. උන්වහන්සේගේ පුද්ගලික බලයෙන්, උන්වහන්සේගේ ස්වභාවයෙන්, උන්වහන්සේගේ චරිතයෙන්, උන්වහන්සේගේ වචනයෙන් සහ උන්වහන්සේගේ නාමයෙන් ජීවත්වෙන්න. ඔබගේම කැමැත්ත මත ජීවත්වීම ඉවත්කර දමා උන්වහන්සේ තුළ ඇති බහුල වූ ජීවිතයේ පූර්ණත්වයෙන් ජීවත්වීම පටන්ගන්න.

ඔබ කිසියම් කණස්සල්ලකින් හෝ බියකින් කටයුතු කරනවා ද ? සියල්ල ක්‍රිස්තුස් වහන්සේට භාරදෙන්න. ඔබ උන්වහන්සේ මරණයෙන් හා නැවත නැගිටීමෙන් උන්වහන්සේ සමඟ එක්සත් වුවහොත් ඔබේ ජීවිතය තවදුරටත් ඔබේම නොවේ. නමුත් එය උන්වහන්සේගේ ජීවිතයයි. ඔබ වෙනුවෙන් තමන්වම පාවා දුන්නා වූ දෙවියන් වහන්සේගේ පුත්‍රයා කෙරෙහි ඇදහිල්ලෙන් සෑම දිනකම ජීවත්වෙන්න. (ගලාති 2:20) සාමය වැනි අපූරු පොරොන්දු ඔබ සිතට ගන්නාවිට ඔබේ සියලු ගැටලු උන්වහන්සේට භාරදෙන්න. "නුඹලා වෙත සමාදානය තබා යමි. මාගේ සමාදානය නුඹලාට දෙමි. මා දෙන්නේ ලෝකයා දෙන්නාක් මෙන් නොවේ. නුඹලාගේ සිත් කැළඹෙන්නටවත් බයවෙන්නටවත් නොදෙල්ලා." (යොහාන් 14:37) "වෙහෙසවෙන්නා වූ බර උසුලන්නා වූ සියල්ලෙනි මා වෙතට වරෙල්ලා. මම නුඹලාට සහනය දෙමි. මම සිතින් මෘදුව යටහත්ව සිටින බැවින්, මාගේ වියගහ නුඹලා පිටටගෙන, මාගෙන් ඉගෙනගනිල්ලා. එවිට නුඹලාගේ ආත්මවලට සහනය ලැබෙන්නේය." (මතෙව් 11: 28-29) **"ස්වාමීන් වහන්සේ තුළ නිතර ප්‍රීතිවෙයල්ලා. ප්‍රීතිවෙයල්ලා යයි නැවතත් කියමි. නුඹලාගේ ඉවසිලිවන්තකම සියලු මනුෂ්‍යයන්ට දැනගන්නට ලැබේවා. ස්වාමීන් වහන්සේ ළංව සිටින සේක. නුඹලා කිසිවක් ගැන කණගාටු නොසිතා, සියල්ලේ දී ස්තුතිදීම සමඟ යාච්ඤාවෙන්ද, කන්නලව්වෙන්ද නුඹලාගේ ඉල්ලීම් දෙවියන්වහන්සේට දන්වාපල්ලා. එවිට කිසි නුවණකින් දැනගත නොහැකි වූ දෙවියන් වහන්සේගේ සමාදානය ක්‍රිස්තුස් යේසුස් වහන්සේ තුළ නුඹලාගේ සිත්ද සිතුවිලි ද ආරක්ෂා කරනවා ඇත."**

(පිලිප්පි 4:4-7)

4පිටුවට

3 පිටුවෙන්

ක්‍රිස්තුස් වහන්සේ අපගේ...

විපත්තිදායක තත්ත්වයන් තුළ දී ක්‍රිස්තුස් වහන්සේ

අවසාන වශයෙන් සමහර විට දැන් ඔබ දුෂ්කර තත්ත්වයක සිටින අතර බලාපොරොත්තුවක් නොමැතිව සිටිනු ඇත. ධෛර්‍යමත් වෙන්න. මන්ද අපි වඩාත්ම දුෂ්කර කාලවලට මුහුණ දී සිටින විට ක්‍රිස්තුස් වහන්සේ අපගේ ජීවිතවල වඩාත්ම විශිෂ්ඨ දේ ඉටු කරනු ලබන සේක. උදාහරණයක් ලෙස අපෝස්තුළු පාවුල් ඔහුගේ මාංසයේ කටුව සමඟ කොයිතරම් දරුණු ලෙස කටයුතු කරනවාද කියනවා නම් එය ඉවත්වන ලෙස ඔහු තුන් වතාවක් ස්වාමීන් වහන්සේගෙන් ඇයද සිටියේය. (2 කොරින්ති 12 : 7-8) කෙසේවෙතත් ඒ මධ්‍යයේ ක්‍රිස්තුස් වහන්සේගේ හැකියාව ඕනෑම තත්ත්වයකට ප්‍රමාණවත් බව ඔහු තවදුරටත් සොයාගනු ලැබුවේය. පාවුල්තුමා මෙලෙස ලියනු ලැබුවේය. **"උන්වහන්සේද, මාගේ කරුණාව නුඹට සෑහේය. මක්නිසාද දුර්වලකමේදී මාගේ බලය සම්පූර්ණවෙන්නේ යයි වට කී සේක.** **එබැවින් ක්‍රිස්තුස් වහන්සේගේ ශක්තිය මා කෙරෙහි පිහිටන පිණිස මාගේ දුර්වලකම් ගැන ඉතා සන්තෝෂයෙන් පාරට්ටුකරන්නෙමි. එහෙයින් ක්‍රිස්තුස් වහන්සේ උදෙසා පැවිණෙන දුර්වලකම්වලටත්, අන්තරායවලටත්, නිගකම්වලටත්, පීඩාවලටත්, විපත්තිවලටත්, ප්‍රසන්නව සිටිමි. මක්නිසාද මම දුර්වලව සිටිනකලම ශක්තිමත්ව සිටිමි."** (2 කොරින්ති 12: 9-10) වෙනත් වචනවලින් පවසන්නේ නම් ක්‍රිස්තුස් වහන්සේගේ කරුණාව, බලය සහ පැමිණීම අපි වැඩියෙන් අත්දකිනවිට පරීක්ෂා කාලයන් සැබවින්ම ආශීර්වාද කාලයන් බවට පත්වේ.

ක්‍රිස්තුස් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය

(ජොනතන් එඩ්වඩ් විසිනි) (1703-1758)

"මංගල්‍යයේ මහත් දවස වූ අන්තිම දවසේ යේසුස් වහන්සේ නැගිට ශබ්ද පවත්වමින් යමෙකුට පිපාසා ඇත්නම් ඔහු මා ළඟට ඇවිත් බීවාවේ." (යොහාන් 7:37) ***"ආත්මයාණන් වහන්සේ ද මනවාලීද, වරෙන්නැයි කියති. අසන්නාද වරෙන්නැයි කියාවා. පිපාසා ඇත්තාද ඒවා කැමති කෙනෙක් ජීවන වතුර නොමිලයේ ගනීවා."*** (එළිදරව් 22:17)

ලෞකික මනුෂ්‍යයන් සිතන්නේ ඔවුන් හඹායන දේවල් තුළ සැබෑ විශිෂ්ඨත්වය සහ සැබෑ සතුට ඇති බවයි. ඔවුන් සිතන්නේ ඒවා ලබාගත හැකි නම් ඔවුන්ට සතුටින් සිටිය හැකි බවයි. ඔවුන් ඒවා ලබාගත්තත් තවම සතුට සොයා ගැනීමට නොහැකි වූ විට වෙනත් දෙයකින් සතුට සොයමින් තවමත් ඒ පසුපස හඹායති. එක්කෙනෙක් ධනය වඩාත්ම විශිෂ්ඨ යැයි සිතන අතර තවත් කෙනෙකුට ඉහළම ගෞරවය හිමිකර ගැනීමට වුවමනා වී තිබේ. වෙනත් කෙනෙකුට වඩාත්ම විශිෂ්ඨ ලෙස පෙනෙන්නේ ලෞකික සතුටයි. නමුත් ආත්මයට මේ කිසිම දෙයකින් තෘප්තියක් සොයාගත නොහැකිය.

නමුත් ක්‍රිස්තුස් යෙසුස් වහන්සේට සැබෑ සහ මහත් වූ ශ්‍රේෂ්ඨත්වයක් (උතුම්කමක්) ඇත. අපි එය දැකීමට පැමිණෙන විට අපි තවදුරටත් එයින් ඈතට නොගොස් ඒ තුළ රැඳී සිටියි. අපි උන්වහන්සේ තුළ ඇති විශිෂ්ඨ තේජසක් සහ විස්තර කළ නොහැකි මිහිරි බවක් දකින්නෙමු. අපි මෙතෙක් සෙවනැලි සොයා ගිය නමුත් දැන් අපි සාරය සොයාගෙන ඇති බව දකින්නෙමු. අපි කලින් ගංගාවේ සතුට සොයමින් සිටිය නමුත් දැන් අපි සාගරය සොයාගෙන ඇත්තෙමු.

ආත්මයට අතිශයින් තෘප්තියක් ගෙනදෙයි

ක්‍රිස්තුස් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය ආත්මයේ ස්වභාවික ආශාවන්ට ප්‍රමාණවත් වන අතර එහි අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමට ප්‍රමාණවත්වේ. ක්‍රිස්තුස් වහන්සේගේ සිත ආශා කරන අසීමිත ශ්‍රේෂ්ඨත්වයක් ඇත. එයට සීමාවක් සොයාගත නොහැකිය. සිතෙන් උන්වහන්සේව මෙනෙහි කරන තරමට උන්වහන්සේ විශිෂ්ඨ ලෙස ප්‍රකාශ වන සේක. සෑම අලුත් සොයා දැනගැනීමක්ම උන්වහන්සේගේ අලංකාරය වඩාත් ආකර්ෂණීය කරයි. මනසට අවසානයක් නොපෙනේ. ගැඹුරට සහ වඩාත් ගැඹුරට යාමටත්, කිසි විටෙක පහළට නොපැමිණීමටත් උන්වහන්සේගේ විශිෂ්ඨත්වය ප්‍රමාණවත් වේ.

උන්වහන්සේගේ අලංකාරය දෙස මුලින්ම බලන විට ආත්මය ප්‍රීතියෙන් ඉපිල යන්නේය. එමෙන්ම එය විඩාවට පත්වන්නේ නැත. ක්‍රිස්තුස් වහන්සේගේ විශිෂ්ඨත්වය නිතරම නැවුම්ව අළුත්ව තිබේ. වසර දහස් ගණනක් හෝ දසදහස් ගණනක් තිස්සේ එක මොහොතක් උන්වහන්සේගේ අලංකාරය දකින විට එය වඩ වඩා අතිශයින් ප්‍රීතියට පත්කරනු ලබන්නේය. ක්‍රිස්තුස් වහන්සේගේ උත්කෘෂ්ඨභාවය මනුෂ්‍යයාගේ උසස් වූ කාරණාවලට ප්‍රධානියාවීමට යෝග්‍යය වන සේක. මෙම විහිෂ්ඨත්වය අවබෝධ කරගෙන භාවිතා කිරීම තරම් බලවත්, උතුම් හෝ විශිෂ්ඨ දෙයක් නොමැත. යේසුස් වහන්සේගේ මෙම උතුම්කම ආත්මයට වඩාත්ම උචිත ආහාරයයි. ක්‍රිස්තුස් වහන්සේ වෙතට පැමිණෙන පුද්ගලයන් මෙයින් පෝෂණය වී ඒ මත ජීවත්වේ. එය ස්වර්ග යෙන් බැස ආවා වූ ආහාරයයි. එයින් අනුභව කරන්නා කිසිදාක මරණයට පත්වන්නේ නැත. (යොහාන් 6:50) එය දේවදූයන්ගේ ආහාරයයි. එය මුදල් නොමැතිව සහ මිලයකින් තොරව ලබාදෙන මිදි යුෂ සහ කිරිය. (යෙසායා 55: 1-2) ඇදහිලිවන්තයාගේ ආත්මය සතුටු කරන තෙල් මෙයයි. මෙහිදී ආශාවෙන් සිටින ආත්මය තෘප්තිමත් වන අතර කුසගින්නෙන් පෙළෙන ආත්මය යහපත්කමින් පිරී ඉතිරී යන්නේය. එමෙන්ම එය ප්‍රමාණවත්ව තිබෙන බව දැකගත හැකිය. වචනයෙන් කිව නොහැකි සහ සම්පූර්ණ මහිමය සහිත හොඳ කාලය අවබෝධ කරගත හැකිය. ජීවන ජලය ගලායන්නා වූ ගංගාව සොයාගනු ඇත. එයින් හැර වෙන කිසිවකින් පානය කිරීමට ආශා නොවන්නේය. ජීවනයේ ආහාරය සොයාගනු ලබන අතර එයින් හැර වෙන කිසිවකින් අනුභව කිරීමට ආශා නොවන්නේය.

ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රේමය

ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රේමය විදහාපෑම ආත්මයට මහත් වූ තෘප්තියක් ගෙනදෙයි. ක්‍රිස්තුස් වහන්සේගේ මෙම ප්‍රේමය අතිශයින් මිහිරි සහ තෘප්තිමත්ය. මන්ද එය එවැනි විශිෂ්ඨත්වයක් හා ගෞරවයක් ඇති පුද්ගලයෙකුගේ ප්‍රේමය බැවින් එය ජීවිතයට වඩා අනර්ඝ වේ. ලෝකයේ මැවුම්කරුවාණන් වන සියල්ල සෑදුවාවූ පියාණන් වහන්සේගේ දකුණු පැත්තේ සිටීමට උසස් කර ඇති ස්වර්ගීය ස්ථානවල සියලු බලය සහ සියල්ලට ප්‍රධානියා වන සියල්ල තමන්වහන්සේගේ දෙපායට තබා තිබෙන්නා වූ ස්වාමීන්ගේ ස්වාමීන් වන, රජුන්ගේ රජතුමා වන පියාණන් වහන්සේගේ මහිමය බබළවන්නා වූ උන්වහන්සේගේ ප්‍රේමය හිමිකර ගැනීම කොයිතරම් සතුටු විය යුතුද ?

ක්‍රිස්තුස් වහන්සේගේ මෙම ප්‍රේමය එහි ශ්‍රේෂ්ඨත්වයෙන් අතිශයින් මිහිර හා තෘප්තිමත්ය. එවැනි ප්‍රේමයක් මීට පෙර කිසිදා දැක නොතිබූ අතර එය වෙනත් කිසිවකට සමකළ නොහැකිය. මෙම ප්‍රේමයේ තෘප්තිමත් ස්වභාවය පැන නැගින්නේ මිහිරිඵල වලින්ය. ක්‍රිස්තුස් වහන්සේ තම සෙනඟට ලබාදෙන වටිනා ප්‍රතිලාභ සහ උන්වහන්සේ ලබාදී ඇති වටිනා පොරොන්දු මෙම ප්‍රේමයේ ඵල වන්නේය. ප්‍රීතිය සහ බලාපොරොත්තුව යනු ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රේමයේ උල්පතෙන් නිරන්තර ගලායන දිය පහරවල්ය.

ක්‍රිස්තුස් වහන්සේ තමන්වම පාවා දුන් සේක.

මනුෂ්‍යයා කෙරෙහි ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රේමය අපි උසස්කොට සලකමින් එය පිළිගත යුතුය. එසේ උන්වහන්සේ ඔවුන්ගේ සියලු නපුරට පිළියමක් වීමටත්, සියලු යහපතෙහි උල්පතක් වීමටත් තමන්වහන්සේව ලබාදුන් සේක. අපට අවශ්‍ය සියල්ලවීමට ක්‍රිස්තුස් වහන්සේ අපට තමන්වහන්සේව ලබා දුන් සේක. අපට ඇදුම් අවශ්‍යවේ. එවිට උන්වහන්සේ අපට ඇඳුම් ලබාදෙනවා පමණක් නොව පැළඳ ගැනීමට උන්වහන්සේම අපගේ ඇඳුම් වන සේක. ***"මක්නිසාද නුඹලාගෙන් ක්‍රිස්තුස් වහන්සේ තුළට බෞතිස්ම කරනු ලැබූ සියල්ලෝ ක්‍රිස්තුස් වහන්සේ පැළඳගත්තෝය." (ගලාති 3:27)*** ***"නුවුත් තෘෂ්ණා පූර්ණකරන පිණිස මාංසයට පංගාඩමක් නොකොට ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ පැළඳගනිල්ලා." (රෝම 13:14)***

අපට ආහාර අවශ්‍ය වූ විට ක්‍රිස්තුස් වහන්සේ අපගේ ජීවනදායක ආහාරයවීමට තමන්වහන්සේවම පාවාදුන් සේක. උන්වහන්සේගේ මාංශය රොටි ලෙසත්, උන්වහන්සේ රුධිරය අපගේ මිදි යුෂ ලෙසත් පානය කිරීමට දුන් සේක. මේ තුළින් යේසුස් වහන්සේ අපට පවසන්නේ උන්වහන්සේ ස්වර්ගයෙන් බැස ආ ආහාරය බවත් ජීවනයේ ආහාරය බවත්ය. (යොහාන් 6 වන පරිච්ඡේදය)

අපට වාසස්ථානයක් අවශ්‍ය වේ. එවිට අපගේ ජීවිතය නැවති නිවසින් සහ අපගේ වාසස්ථානය වන නිවසින් පාපය ඉවත්කර ක්‍රිස්තුස් වහන්සේ තම සෙනඟගේ වාසස්ථානයවීමට ඉඩ ලබා දී ඇත. " ස්වාමීනී, සියලු පරම්පරාවල ඔබ අපේ වාසස්ථානය වූ සේක. " (ගීතාවලිය 90:1) දෙවියන් වහන්සේ උන්වහන්සේගේ සෙනඟට පොරොන්දු වී ඇත්තේ ඔවුන් දෙවියන් වහන්සේගේ මාලිගාවේ සදාකාලයටම වාසය කරන බවත්, එයින් ඉවත්ව නොයන බවත්ය. එමෙන්ම ක්‍රිස්තුස් වහන්සේ නව යෙරුසලමේ දේවමාළිගාව බවද අපට පවසා ඇත.

ක්‍රිස්තුස් වහන්සේ තම සෙනඟට අවශ්‍ය සියල්ල වීමටත්. ඔවුන්ගේ සතුටට හේතුවන සියල්ල වීමටත් තමන්වහන්සේවම ලබා දුන් සේක. "එහි ග්‍රීකයෙක්වත්, යුදෙව්වෙක්වත්, චර්මඡේදයෙක්වත්, ස්කිතියෙක්වත්, දාසයෙක්වත්, නිර්දාසයෙක්වත් සිටිනවා නොව, ක්‍රිස්තුස් වහන්සේ සියල්ලව සියල්ලන් තුළ සිටින සේක." (කොලොස්සි 3:11) උන්වහන්සේ එසේවීම සඳහා අවශ්‍ය වූ කිසිවක් ප්‍රතික්ෂේප කර නැත. එම නිසා මනුෂ්‍යයෙක් ලෙස මාංශවත් වී මෙළොවට පැවිණීමට සිදු වූ විට එය ප්‍රතික්ෂේප නොකර, මනුෂ්‍යයෙක් ලෙස මෙළොවට පැවිණ සේවකයෙකුගේ ස්වරූපයෙන් පෙනී සිටි සේක. උන්වහන්සේ මරණයට පත්වීමට අවශ්‍ය වූ විට එයද ප්‍රතික්ෂේප නොකළ සේක. අප වෙනුවෙන් කුරුසිය දරාගෙන කුරුසියේ දී මරණයට පත් වූ සේක.

සදාකාලිකවම තේජසින්, ප්‍රීතියෙන්, උසස්කොට සලකමින් ප්‍රශංසා කිරීමට වටින්නා වූ ප්‍රේමය මෙයයි.

"මේක පව්කමාව පිණිස බොහෝ දෙනා උදෙසා වගුරුවන අළුත් ගිවිසුමේ මාගේ ලේය." (මතෙව් 26:28)

යේසුස් වහන්සේ සැබෑ මිදිවැලයි

අපි සත්‍යතාවය සරලව සහ නිර්හීතව ප්‍රකාශ කරමු. ස්වාමීන් වන යේසුස් වහ්නසේ අන් අය සඳහාය. මිදිවැල තමන්ගේම ප්‍රබෝධය සඳහා නොව අන් අයගේ ප්‍රබෝධය සඳහා මිදි දරන්නාක් මෙන් මෙම දිව්‍ය මිදිවැල සෑමවිටම අන් අය සඳහා පමණක්වීමට සහ ක්‍රියා කිරීමට තෝරාගෙන ඇත. උන්වහන්සේ කළ සියල්ල අන් අය සඳහාය. උන්වහන්සේ තම ජීවිතය පූජා කළ විට එය අන් අය සඳහාය. උන්වහන්සේ නැවත මළවුන්ගෙන් නැගිටුණු විට එයත් තමන්වහන්සේව සහ තමන්වහන්සේගේ ප්‍රකාශ සාධාරණීයකරණය කිරීමට වඩා අන් අයව සාධාරණීකරණය කිරීම බොහෝ සෙයින් වැඩි විය. (රෝම 4:25)

තවද උන්වහන්සේ දැන් ස්වර්ගයෙහි දරණ ස්ථානය අන් අය සඳහා වන්නේය. මක්නිසාද උන්වහන්සේ අප වෙනුවෙන් පෙනී සිටීමට දැන් ස්වර්ගයටම ඇතුල්වී ඇති බව අපි කියවන්නෙමු. (හෙබ්‍රෙව් 9:24) අපි උන්වහන්සේගේ වර්තමාන මහිමයෙන් පූර්ණ සියල්ල ගැන ගායනා කරමු. නමුත් ඒවා උන්වහන්සේගේම වුවත් උන්වහන්සේ ඒවා අප උදෙසා පමණක් තබාගන්නා සේක. පියාණන් වහන්සේ තම පුත්‍රයාණන්ව නැවත නැගිටුවා අන් අය සඳහා සෑම විටම උන්වහන්සේව පත්කර ඇත. ඔබ සහ මම අන් අයට වැරදිකරුවන් හා නුසුදුසු අය වන්නෙමු.

උන්වහන්සේ කවුද යන්න පමණක් නොව උන්වහන්සේගේ අරමුණ කුමක්ද යන්න තීරණය කරන්නේ මෙයයි. උන්වහන්සේගේ කුරුසියේ මිදීම තුලින්, උන්වහන්සේගේ ශුද්ධාත්මයාණන් වහන්සේගේ බලවත් ක්‍රියාවන් තුලින් අනිත් අයව දෙවියන් වහන්සේ වෙතට සහ උන්වහන්සේට නැවත ලබා ගැනීමයි. මෙය උන්වහන්සේගේ පැත්තෙන් ප්‍රාර්ථනා කරන සිතුවිල්ලක් නොව නමුත් ස්වර්ගයේ සම්පත් වලන් පිටුබලය ලබන බැවින් ඉටුවීම නිසැකවම සිදුවන ස්ථීර දිව්‍යමය අරමුණකි. අද දවසේ උන්වහන්සේගේ රුධිරයේ මිලයෙන් මුදවාගත් මේ ලෝකය පුරා මිදිවැල වන යේසුස් වහන්සේ ජාතීන්ගේ සුවය සඳහා තම ඵලය ගෙන එයි. මිය යන පව්කාරයන් එම ඵලය රසවිඳිමින් ජීවත්වෙති.

උන්වහන්සේගේ අරමුණ සඳහා සහයෝගයෙන් කටයුතු කිරීම.

කෙසේ වෙතත් ස්වාමීන් වන යේසුස් වහන්සේ මේ සම්බන්ධයෙන් තනිවී නොසිටින සේක උන්වහන්සේ පාපයෙන් මිදුණා වූ මනුෂ්‍යයන් උන්වහන්සේගේ මහිමාන්විත අරමුණ ඉටුකිරීමේ දී උන්වහන්සේ සමඟ සහයෝගයෙන් ඇදගන්නා අතර උන්වහන්සේ ඔවුන්ව ඵලදරණ අතු බවට පත්කරන සේක. උන්වහන්සේගෙන් තොරව අතුවලට තනිවම කිසිවක් කළ නොහැකිය. එමෙන්ම අතු නොමැතිව මිදිවැල ඵල දරන්නේ ද නැත. කෙසේ වෙතත් අතුවලට ඵල නිපදවීමට හෝ ආරම්භ කිරීමට නොහැකිය. එය සම්පූර්ණයෙන්ම උන්වහන්සේගේ කාර්‍යයයි. උන්වහන්සේ නැවත ඔවුන් තුළ උන්වහන්සේගේ ජීවිතය ගතකරන විට උන්වහන්සේ නිපදවන දේ හුදෙක් ඔවුන් දරාගන්නෝය.

"මිදිවැල මවය නුඹලා අතුය." (යොහාන් 15:5) උන්වහන්සේ සමඟ අපගේ සම්බන්ධතාවය පිළිබඳව ස්වාමීන් වහන්සේ අපට පහදා දෙන චිත්‍රය මෙයයි. ඇදහිලිවන්තයා ක්‍රිස්තුස් වහන්සේ තුළ අත්තක් ලෙස පිහිටුවා ඇති අතර උන්වහන්සේ ඔහු තුළ වාසය කිරීමට පැමිණෙන සේක. අත්ත මිදිවැලට සම්බන්ධ වන්නාක් මෙන්ම මම ක්‍රිස්තුස් වහන්සේට සම්බන්ධවී සිටිමි. උන්වහන්සේ මගේ බව මම දනිමි. මෙයින් අදහස් කරන්නේ අපව ගැලවීම සහ ආශිර්වාදය සඳහා පමණක් ජීවත්වන සහ ක්‍රියාකරන තැනැත්වහන්සේගේ කොටසක් බවට පත්කර ඇති බවත්, උන්වහන්සේ මා වැනි අත්තකින් මනුෂ්‍ය වර්ගයා සඳහා උන්වහන්සේගේ ඵල දැරීමට සූදානම් බවත්ය. අපගේ දුර්වලතාවය ගැන දැනුවත්ව සිටින විට උන්වහන්සේ මිදිවැල බව දැන ගැනීමට අපට මොනතරම් සැනසීමක්ද .. ? නමුත් අනික් අතට අපි අවශ්‍යතා ඇති, කුසගින්නෙන් පෙළෙන මනුෂ්‍යයන් අතරට ගමන් කරන විට මෙය අපට කෙයිතරම් නිර්හීතකමක් සහ අධිකාරියක් ලබාදෙයිද ? මම උන්වහන්සේගේ ශාඛාවකි. මා වටා සිටින අයගේ ආශිර්වාදය සඳහා අසීමිත සම්පත් ඇති උන්වහන්සේගේ කොටසකි.

එකිනෙකාට ප්‍රතිවිරුද්ධ මිදිවැල් දෙකක්

වෙනත් ඕනෑම ශුද්ධ ලියවිල්ලකට වඩා ස්වාමීන් වන යේසුස් වහන්සේ සමඟ අපගේ එකමුතුකම වඩාත් පැහැදිලිව නිරූපණය වන මිදිවැල සහ අතු පිළිබඳ මෙම උපමාව දෙස අපි වඩාත් සමීපව බලමු.

උන්වහන්සේ ආරම්භ කරන්නේ "මම සැබෑ වූ මිදිවැලය." (යොහාන් 15:1) කියමිනි. ග්‍රීක් භාෂාවේ වාක්‍යයක් ගොඩනැගීමේදී සැබෑ යන වචනයට විශේෂ අවධාරණයක් ලබදෙයි. පැහැදිලිවම ස්වාමීන් වහන්සේ සැබෑ මිදිවැල නොවන තවත් මිදිවැලක් සමඟ තමන්වහන්සේව සන්සන්දනය කරමින් සිටින අතර එය අසාර්ථක විය. පැරණි ගිවිසුමේ මේ සඳහා යොමු කිරීම් බහුලව තිබේ. ගීතිකාකරුවා මෙසේ පැවසුවේය. ***"ඔබ මිසරයෙන් මිදිවැලක් ගෙනාසේක. ඔබ ජාතීන් එළවා එය රෝපනය කළ සේක. ඔබ ඊට ඉඩමක් එළිකල සේක. එය ගැඹුරට මුල් අද්දේය. එයින් දේශය පිරුණේය. ඒකේ සෙවනෙන් කදු වැසුණේය. "*** (ගීතාවලිය 80: 8-9) මෙම මිදිවැල ඊශ්‍රායෙල් සෙනඟ වූ අතර දෙවියන් වහන්සේ ඔවුන්ව මිසරයෙන් පිටතට ගෙනැවිත් ඔවුන්ගේම දේශයේ සිටුවීමේ අරමුණ වූයේ ඔවුන් ජාතීන්ට ඵලදරනු ලබනු ඇති බවත් ඒ තුලින් ලෝකයේ සියලු ජාතීන්ට ඔවුන් තුළ ආශිර්වාදය ලැබිය හැකි බවත්ය. නමුත් ඊශ්‍රායෙල් ජාතිය වන එම මිදිවැල එම උසස් අරමුණින් අසාර්ථක විය. මන්ද ඔවුන් තම වරප්‍රසාද සහ ආශිර්වාද තමන්ට පමණක් යැයි සැලකූ අතර ඔවුන් තමන්ගේ දෙවියන් වහන්සේ වෙතින් ඉවත්වී රූප නමස්කාරය වෙතට හැරුණේය. එබැවින් දෙවියන් වහන්සේ මෙසේ පැවසූ බව අසන්නට තිබේ. ***"ඊශ්‍රායෙල් විහිදී යන්නා වූ වලදබණ මිදිවැලක්ය. තමාගේ වල වැඩි වූ පලණට ඛහු පූජාසන වැඩි කළේය. ඛහුගේ දේශයේ සාරවත්භාවයේ හැටියට ඛවුහු අලංකාර වූ රූපස්තම්භ සැදුවෝය."*** (හෙෂෙයා 10:1) කොළ ඕනෑතරම් තිබුණත් දෙවියන් වහන්සේට හෝ මනුෂ්‍යයන්ට එහි ඵල තිබුණේ නැත. ඊශ්‍රායෙල් සම්බන්ධයෙන් උන්වහන්සේ තවත් තැනක මෙසේ විලාප නගන සේක. ***"එහෙත් මා විසින් නුඹ හොඳ මිදිවැලක් ද මුළුමනින්ම හරිවූ බීජයක් ද කොට හිටුවා තිබුණේය. එසේ වී නම් නුඹ වෙනස් වී මට වල් මිදුවැලක නරක් වූ පැලයක් වුනේ කොහොමද .. ? "*** (යෙරමියා 2:21)

කෙසේ වෙතත් පරණ ගිවිසුමේ මිදිවැලේ අසාර්ථකත්වය පිළිබඳව වඩාත්ම නාට්‍යාකාර ඡේදය වන්නේ යෙසායා 5 වන පරිච්ඡේදයේ සඳහන් මිදවත්තේ සුන්දර ගීතයයි. ***"මාගේ ප්‍රේමවන්තයාගේ මිදිවත්ත ගැන ඛහුගේ ගීතිකාව මාගේ ප්‍රේමවන්තයා උදෙසා ගීතිකා කරන්නෙමි. මාගේ ප්‍රේමවන්තයාට ඉතා සාරවත් කන්දක මිදිවත්තක් තිබුණේය. ඛහු ඒක වටකොට අගලක් කපා, ගල් අහක්කොට, ඉතා හොඳ මිදිවැල් සිටුවා, එහි මැද මුරකොටුවක් ගොඩනගා, එහි මිදි යන්ත්‍රයක් සාදා හොඳ මුදික ඵල හටගන්නවා ඇත*** කියා බලා සිටියේය. නමුත් හටගත්තේ වල්මිදි ඵලය, ඉතින් යෙරුසලමේ වැසියනි, යුදාහී මුනෂ්‍යයෙනි, මා සහ මාගේ මිදිවත්ත අතරේ විනිශ්චය කරපල්ලා. මාගේ මිදිවත්ත උදෙසා මා විසින් නොකළා වූ වෙන කුමක් කරන්ට පුළුවන්ව තිබුණේ ද ? එහි හොඳ මුදික ඵල හටගන්නවා මා බලා සිටි විට වල් මුදික ඵල හටගත්තේ මක්නිසාද ... ?" **(යෙසායා ෫ : 1-4)**

අපගේම අසාර්ථකත්වය

මෙය ඊශ්‍රායෙල් ගැන පමණක් නොව අපටත් අදාළ උපමාවකි. දෙවියන් වහන්සේ අප වෙනුවෙන් කළ දේට වඩා තවත් කිරීමට ඉතිරිව තිබුණේ කුමක්ද.... ? අපෙන් බොහෝ දෙනෙකුට

යහපත් හා දේවභක්තික හැඳිවැඩීමක් ගැන ආපසු හැරී බැලිය හැකිය. අන් අයගේ ජීවිත නරක්කරන බොහෝ දේවලින් අප බේරුණු විට ඉන්පසු කරුණාවේ පණිවිඩය අසා යේසුස් වහන්සේව අපගේ ගැලවුම්කරුවාණන් ලෙස පිළිගැණුනු දවස පැමිණියේය. ඒ දවස් වලින් පසු අපූරු වරප්‍රසාද සහ තවත් බොහෝ දෙනෙකුට අහිමි වූ ආශිර්වාද අපට ලැබුණි. අපට ඉගැන්වූයේ සමහර විට ශුද්ධ ලියවිලි පිළිබඳ මනා දැනුමක් ඇති ගුරුවරුන් විසින් අපි වෙනත් ශුද්ධවන්තයන් සමඟ සහභාගීත්වය භුක්ති වින්දෙමු. අපගේ අතේ සූදානම්ව ඇති සේවාවන් සඳහා දෙවියන් වහන්සේ අප උකුලට ගණන් කළ නොහැකි ආශිර්වාද වත් කළ සේක. මිදිවතු හිමියාගේ පුද්ගලික අවධානය අප වෙත තිබුන සේක. මක්නිසාද උන්වහන්සේ බොහෝ විට කප්පාදු කිරීමේ දී සහ සුවකිරීමේ දී අප වෙත පැමිණි සේක. අප සෑම කෙනෙකු ගැනම විවිධ මට්ටම්වලින් දෙවියන් වහන්සේට පැවසීමට ඇත්තේ මාගේ මිදිවත්ත උදෙසා මා නොකළ දෙයක් තවත් කිරීමට ඉතිරිව තිබුණේද කියාය. එහෙත් උන්වහන්සේ මිදි එනම් උන්වහන්සේව මහිමයට පත්කරන අන් අයට ආශිර්වාදයක් වන ආත්මයාණන්ගේ ඵල සොයන විට අපි පිටතට ගෙන ආවේ මාංශයේ අපවිත්‍ර ක්‍රියාවන වල් සහ කටුක මිදි පමණි. දෙවියන් වහන්සේ අපෙන් නිතරම ලබාගෙන ඇති සියල්ල වන මෙම ක්‍රියා දෙස නැවත බලන්න. ***"ඉදින් මාංශයේ ක්‍රියා ප්‍රකාශව තිබේ. එනම් වෛශ්‍යාකම අපවිත්‍රකම, සල්ලාලකම, රූපවැදීම, මායාව, සතුරුකම්, විවාදය, ඊර්ෂ්‍යා, ක්‍රෝධ, පක්ෂවාදිකම්, භේද, ලබ්ධි භේද, වෛර, ඛීවත්කම, මංගල්‍ය ෂෝෂා සහ තවත් එවැනි දේවල්ය. වෙඛදු දේ කරන්නන්ට දෙවියන් වහන්සේගේ රාජ්‍යයෙහි උරුම නොලැබෙන බව මම නුඹලාට පූර්ව කී ලෙසට, දැනුත් කලින් නුඹලාට කියමි."*** (ගලාති 5:19-21)

ලිංගික අපවිත්‍රකමේ සිට ඊර්ෂ්‍යාවේ සහ පක්ෂවාදීකමේ ආත්මයක් දක්වා ඇඹුල් හා වේදනාකාරී සෑම දෙයක්ම මෙහි තිබේ. නමුත් දෙවියන් වහන්සේට සහ මනුෂ්‍යයන්ට අවශ්‍යය කිසිවක් නැත. මෙයින් අපගේ නිවසේ සිටින අයට, රැකියා ස්ථානයේ සිටින අයට සහ අපගේ දේවස්ථානයේ අයට ලබා දී ඇත්තේ එම ඇඹුල් ඵල වේ. මෙම ඇඹුල් ඵල දෙවියන් වහන්සේ විසින් බොහෝ වරප්‍රසාද සහ බොහෝ ආශිර්වාද ලබා දී ඇති මිදිවැලක් මත හටගෙන ඇත. අපි එය එසේ නොවන බවට සහතික කර ඒ වෙනුවට අරගල කරන විට පවා තත්ත්වය එය බව අමුතුවෙන් කිව යුතු නැත.

වැටුණු මිනිසාගේ ස්වභාවය

දැන් මෙය අපගේ අත්දැකීම වී තිබෙන්නේ ඇයි ... ? පරණ ගිවිසුමේ දෙවියන් වහන්සේගේ මිදිවැල වන ඊශ්‍රායෙල්ගේ තත්ත්වය මෙය වූයේ ඇයි .. ? සරල හේතුව වූයේ ඊශ්‍රායෙල් සෙනඟ මිදිවැල වූ තාක්කල් ඇයට මිහිරි මිදිඵල නිපදවීමට නොහැකි විය. මක්නිසාද ඇඹුල්සහ වල් මිදි ඵල වැටුණු මිනිස් ස්වභාවයේ ලක්ෂණයකි. මන්ද එහි කේන්ද්‍රය එයම විය. මිහිරි මිදිඵල නිපදවීමට මිනිස් ස්වභාවය වැඩිදියුණු කළ හැකිව තිබුණේ නම් එය ඊශ්‍රායෙල් පිළිබඳ කාරණයේ දී ද දැකිය හැකි වනු ඇත. මක්නිසාද කිසිම මිදිවැලකට නොලැබුණ තරම් බොහෝ දේ දෙවියන් වහන්සේගෙන් ඔවුන්ට ලැබුණි. නමුත් ඊශ්‍රායෙල්ගේ අසාර්ථකත්වය තුළින් පෙන්නුම් කළේ දෙවියන් වහන්සේ වෙනුවෙන් ඵල නිපදවීමට මනුෂ්‍යයාට මිදිවැලක් වීමට කිසිදාක නුපුළුවන් බවයි. අපගේ අසාර්ථකත්වයට හේතුවද එයයි. එනම් අපි මිදිවැලවීමට උත්සාහ කිරීමයි. ශුද්ධ ලියවිල්ලේ කිසිවිටෙකත් අපට බලාපොරොත්තුවීමට දිරිගන්වන්නේ නැති ශුද්ධකමක් අප තුළ සහ අපගෙන්ම අන් අය කෙරෙහි ප්‍රේමයක් සොයා ගැනීමට අපි උත්සාහ කර ඇත්තෙමු. ***"එක්නිසාද මා තුළ එනම් මාගේ මාංසය තුළ කිසි යහපතක් වාසය නොකරන බව දනිමි. එක්නිසාද කැමැත්ත මට ඇත්තේය. නුමුත් යහපත්***

6 පිටුවට

5 පිටුවෙන්

යේසුස් වහන්සේ සැබෑ...

දෙය කිරීම මට නැත්තේය.” (රෝම 7:18) යැයි පැවසූ විට පාවුල් අපට බොහෝ කලකට පෙර සොයාගත් දේ අපි ද සොයාගෙන ඇත්තෙමු. එම සොයා ගැනීම කළ තවත් අයෙක් වරක් මෙසේ යාච්ඤා කළේය. " අහෝ ...., දෙවියන් වහන්ස, මම මා වීම නිසා මා කරන වරදට මට සමාව දුන මැනව.

සැබෑ මිදිවැල සහ අතු

එසේ නම් ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේ තමන්වහන්සේ සමඟ සන්සන්දනය කරන මිදිවැල මෙයයි. එබැවින් දෙවියන් වහන්සේට එතරම් දුකක් වූ මිදිවැලේ නටඹුන් මැද සිටගෙන උන්වහන්සේ පැවසුවේ.., **“මම සැබෑ වූ මිදිවැලය...”** (යොහාන් 15:1) කියාය. එය උන්වහන්සේ පැවසූ ආකාරයටම විය. මනුෂ්‍යයා මිදිවැලවීමේ දවස අවසන්ය. මිදිවැල ලෙස දෙවියන් වහන්සේගේ විනිශ්චය කුරුසිය මත සහ මාගේ ශරීරය තුළ සම්පූර්ණ කළ යුතු විය. දැන් මාගෙන් දෙවියන් වහන්සේගේ ඵල සොයාගත හැකි අතර වෙනත් තැනකින් එසේ කළ නොහැකිය. නිවැරදිව තේරුම්ගත හොත් අපට ලැබිය හැකි හොඳම පුවත මෙයයි. දෙවියන් වහන්සේ තවදුරටත් අප මිදිවැලවීම අපේක්ෂා නොකරන සේක. අපිත් ඵලෙසවීමට උත්සාහ කිරීමවත් අවශ්‍ය නොවේ. ඵල නිපදවීමේ වගකීම තවදුරත් අපගේ නොවේ. දෙවියන් වහන්සේට උන්වහ්නසේගේම සැබෑ මිදිවැලක් ඇත. එනම් උට්ඨාන වූ ස්වාමීන් වන යේසුස් වහන්සේ අන් අයට අවශ්‍ය වූ සියලු ඵල නිපදවීමට සහ මනුෂ්‍යයන් සඳහා උන්වහන්සේගේ කරුණාවේ සියලු අරමුණු ඉටුකිරීමට උන්වහන්සේට හොඳින් හැකියාව තිබෙන සේක.

සරලවම පවසන්නේ නම් අපි, මිදිවැල වන යේසුස් වහන්සේ තුළ ඇති අතු වන්නෙමු. අප මිදිඵල නිපදවන්නේ නැත. නමුත් උන්වහන්සේට අප තුළ ජීවත්වීමට ඉඩදෙන විට උන්වහන්සේ නිපදවන දේ දරාගන්නෙමුව. පාවුල්ගේ වචන මෙයට නව ආලෝකයක් ලබා දෙයි. **“මම ක්‍රිස්තුස් වහන්සේ සමඟ කුරුසියෙහි ඇණ ගසනු ලැබ සිටමි. එසේවී නමුත් මම ජීවත්වෙමි. නුමුත් තවත් මා නොව ක්‍රිස්තුස් වහන්සේ මා තුළ ජීවත්වන සේක. තවද මා දැන් මාංසයෙහි ජීවත්වන ජීවිතය මට ප්‍රේම කළා වූ, මා උදෙසා තමන්ම පාවා දුන්නා වූ දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් වහන්සේ කෙරෙහි ඇදහිල්ලෙන් ජීවත් වෙමි.”** (ගලාති 2:20) ක්‍රිස්තුස් වහන්සේ සමඟ පාවුල්ව කුරුසියේ ඇණ ගසා ඇත. එසේ වුවත් පාවුල් ජීවත් විය. ඒ කුමක්ද ..? මිදිවැල වන ක්‍රිස්තුස් වහන්සේ සමඟ කුරුසියේ ඇණගසනු ලැබූ පාවුල් ඔහුගේ උපරිමයෙන් ක්‍රියා කිරීමට උත්සාහ කළේය. **කෙසේ** වෙතත්, පාවුල් මිදිවැලේ අත්තක් ලෙස ජීවත් විය. තමාගේම ආත්ම විශ්වාසයෙන් මිදීමට ලක්වී ඔහුගේ ස්වාමීන් වහන්සේ මත යැපුණේය. එමෙන්ම පාවුල් අත්තකි. ස්වාමී වූ යේසුස් වහන්සේ නැවත ඔහු තුළ ජීවමානව වැඩ වාසය කරන සේක. පාවුල්තුමා පැවසුවේ, **“එසේ වී නමුත් මම ජීවත් වෙමි. නුමුත් තවත් මා නොව ක්‍රිස්තුස් වහන්සේ මා තුළ ජීවත්වන සේක.”** යනුවෙනි. මිදිවැලේ සාරයෙන් අත්ත ජීවත්වන්නාක් මෙන් යේසුස් වහන්සේ ඔහුට මිදිවැල බවට පත් වූ අතර එය ඔහුගේ ජීවිතයේ හා සේවයේ දකින්නට ලැබුණු සියලු ඵලවල මූලාශ්‍රයයි.

පසුතැවිලිවී ආපසු හැරී එන්න.

අපගේ දෛනික ජීවිතයේ අත්දැකීම් තුළ මේ සියල්ල ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට දැන් අපි පැමිණෙමු. අපෙන් ඕනෑම කෙනෙකුට ඕනෑම වෙලාවක, බොහෝ විට නොදැනුවත්ව මිදිවැලේ ස්ථානය භාරගත හැකිය. අපි දවස ආරම්භ කරන්නේ එය අපගේ දවස ලෙසයි. අපි අපගේ දවස සඳහා අපගේ සැලසුම් සකස් කරගෙන ස්වාමීන් වහන්සේ වෙනුවෙන් අපගේ උපරිමය කිරීමට සම්පූර්ණයෙන්ම අදහස් කරන්නෙමු. වගකීම සහ පාලනය සැබවින්ම අපගේ උරහිස මත ඇත අතර අපි සියුම් ලෙස මිදිවැල බවට පත්ව ඇත්තෙමු. නමුත් එය අපගේ දවස වන නිසාත්, අපිම මිදිවැල බවට පත්ව ඇති නිසාත්, දේවල් ඉක්මනින් වැරදී යයි. මනුෂ්‍යයන් සහ වාතාවරණයන් අපගේ කාල සටහන අවුල් කර අපට කිරීමට අවශ්‍ය කරන දේට බාධා කරන අතර අපගේ හදවත් තුළ දැඩි බව කෝපය සහ අමනාපය බොහෝ විට පවතින්නේය. අපගේ තොල්වල තියුණු ප්‍රතිචාරයක් ඇත. මිදිවැල වීමට උත්සාහ කිරීමේ සිතුවිල්ලම අපව ආතතියට පත්කරන අතර ආතතිය සෑමවිටම අපව තවදුරටත් පාපයට නැඹුරු කරයි. අපට යම් විශේෂ කිතුණු සේවයක වගකීමක් පැවරී ඇත්නම් අපගේ ආතතිය සහ ප්‍රතික්‍රියා බොහෝ විට ඊටත් වඩා නරක් වන අතර ඒවා පාපයක් ලෙස නොකියා අපට එම සේවයට යා හැකිය. අපි ලැජ්ජාවට හා පරාජයට පත්වී ආපසු හැරී ඒම පුදුමයක් නොවේ.

කෙසේ වෙතත් පසුතැවිලිවීමේ මාර්ගය අපට විවෘතව පවතී. අපගේ සැබෑ මිදිවැල වන යේසුස් වහන්සේම බොහෝ සාමාන්‍ය මිදිවැලක් මෙන් කල්වාරි කනුව නම් කණුවක බැඳ තිබේ. පසුතැවිලි වී උන්වහන්සේ වෙතට පැමිණෙන ලෙසත්, මේ දේවල මූලාශ්‍රය අපි මිදිවැල වීමට දරණ උත්සාහය බව පාපොච්චාරණය කරන ලෙසත්, උන්වහන්සේගේ දැතින් සමාව සහ පවිත්‍ර කිරීම ලබාගන්නා ලෙසත් උන්වහන්සේ අපට ආරාධනා කරන සේක. එවිට අසාර්ථකත්වයේ ස්ථානයේදීම යේසුස් වහන්සේගේ ජීවිතයේ සහ ස්වභාවයේ පවතින ආත්මයාණන් වහන්සේගේ ඵලදැරීමට අපට හැකිවේ. ඒවා කොයිතරම් වටිනා ඵලදැරීමක්ද .. ? ඒ සියල්ල අන් අයගේ ආශිර්වාදය සඳහා වන අතර ඒ සියල්ල උන්වහන්සේට ආවේණික වේ. අපට ආවේණික වූ මාංශයේ ක්‍රියාවලට වඩා ඒවා කොයිරතම් වෙනස්ද .. ? **“නුමුත් ආත්මයාණන් වහන්සේගේ ඵල නම් ප්‍රේමය, ප්‍රීතිය, සමාදානය, ඉවසිලිවන්තකම, කරුණාවන්තකම, යහපත්කම, විශ්වාසකම, මෘදුකම, පමණ දැන ක්‍රියාකිරීම යන වේවාය. මෙබදු දේට විරුද්ධව චෝදනාවක් නැත. ”** (ගලාති 5:22-23)

එබැවින් ශුද්ධ ලියවිල්ලේ ආත්මයාණන් වහන්සේගේ ඵල ගැන ඒකවචනයෙන් කථා කරන බැවින් මේ සියල්ල මුලින් අඩංගු දෙයෙහි කොටස් බව පෙනේනේ ප්‍රේමය සියල්ල ඇතුළත් ඵලයයි. එනම් උන්වහන්සේ මනුෂ්‍යයා කෙරෙහි දක්වන ප්‍රේමයයි. කෙසේ වෙතත් පසුතැවිලිවීම සෑමවිටම ජයග්‍රහණයේ මාර්ගයයි. දෙවියන් වහන්සේ අපට පෙන්වා දෙන පරිදි මාංශයේ ක්‍රියා ගැන පසුතැවිලිවන විට මිස යේසුස් වහන්සේට අපගේ මිදිවැල විය නොහැකිය. අපි වඩාත් සම්පූර්ණයෙන් උන්වහන්සේව විශ්වාස කිරීමට සහ උන්වහන්සේ මත රැඳී සිටීමට පැමිණෙන්නෙමු. පාපය පිළිගෙන පසුතැවිලිවීමක් නොමැතිව කිසිවිටෙකත් උන්වහන්සේගේ ජයග්‍රණය ගෙන එන්නේ නැත. උන්වහන්සේ මට මිදිවැල වන්නේ මම මිදිවැලවීමට උත්සාහ කිරීම ගැන පසුතැවිලි වන විට පමණි. මාගේ ප්‍රේමය නොමැතිකම ගැන පසුතැවිලි වන විට පමණක් මට උන්වහන්සේගේ ප්‍රේමය ලැබේ. මගේ කණස්සල්ල සහ සාමය නොමැතිකම ගැන පසුතැවිලි වන විට පමණක් මට උන්වහන්සේගේ සාමය ලැබේ. මගේ නොඉවසිලිවන්තකම ගැන පසුතැවිලි වන විට පමණක් උන්වහන්සේගේ ඉවසිලිවන්තකම මට ලබාදෙන සේක. මගේ අමනාපය ගැන පසුතැවිලි වන විට පමණක් උන්වහන්සේගේ මෘදුකම මට ලැබේ.

ඊටත් වඩා උන්වහන්සේ මිදිවැලවීමටත්, අපි අතු බවට පත්වීමටත් අපි කැමති වූ විට උන්වහන්සේගේ ගැලවීමේ සහ අනිත් අයගේ ජීවිත සඳහා ආශිර්වාද කිරීමේ අරමුණ ක්‍රියාත්මකවීමට පටන් ගනියි. පුදුම වූ කාරණා නිකම්ම ඉටුවීමට පටන් ගනියි. පුදුමාකාර ස්වාමියෙකු වන උන්වහන්සේට පුදුමාකාර දේවල් සාමාන්‍යය දේවල් වන සේක. අනිත් අයව බේරා ගැනීමට සහ නැවත පිඹිදවීමට අපි උන්වහන්සේට ඒත්තු ගැන්වීමට අවශ්‍යය නැත. මෙය උන්වහන්සේගේ කාර්යයයි. උන්වහන්සේ ක්‍රියා කිරීමට පටන් ගන්නේ අපි යාච්ඤා කිරීමට සහ විශ්වාස කිරීමට පටන් ගත් විට පමණක් නොවේ. උන්වහන්සේ සෑමවිටම ක්‍රියා කරන සේක. නමුත් අපි උන්වහන්සේට සම්බන්ධ වී නැත. අපි යාච්ඤා කිරීමට සහ විශ්වාස කිරීමට පටන්ගත් විට උන්වහන්සේ දැනටමත් නිතරවී සිටින අරමුණුවලට හසුවී ඵලදරන අතු බවට පත්වනෙමු. මෙය අපගේ අත්දැකීම වන ප්‍රමාණය අපි උන්වහන්සේගෙන් අපේක්ෂා කරන ප්‍රමාණයයි.

යේසුස් වහන්සේ කෙරෙහි ඇදහිල්ලෙන් බලන්න.

උන්වහන්සේගේ ඵල අප කෙරෙහි දරන්ටත්, උන්වහන්සේගේ අරමුණු අප තුලින් ඉටුවීමටත් නම්, අතු වශයෙන් අපගේ කොටස කුමක්දැයි අවසාන වශයෙන් අපි දැන් අසන්නට පැමිණෙන්නෙමු.

පළමුව අපි ඇදහිල්ලෙන් යේසුස් වහන්සේ මිදිවැල ලෙස නිරන්තරයෙන් දැකිය යුතුය. අනිත් අය කෙරෙහි ඇති ප්‍රේමය සහ උන්වහන්සේගේ අරමුණු, උන්වහන්සේගේ අසීමිත හැකියාවේ බලයෙන් යුතුව ක්‍රියාත්මක කරන තැනැත්වහන්සේය. උන්වහන්සේ කිසිවිටෙකත් පරාජය වන්නේ නැත. උන්වහන්සේ කිසිවිටෙකත් අධෛර්‍යමත් නොවේ. උන්වහන්සේ කිසිවිටෙකත් අසාර්ථක නොවේ. උන්වහන්සේ අපගේ මිදිවැලයි. අපගේ දුර්වලකම් සහ අපගේ හිස් බව උන්වහන්සේට බාධාවක් නොවේ. ඒවා ඇත්තටම උන්වහන්සේව ඔප්පු කිරීමට තවත් වැඩියෙන් ඉඩක් ලබාදෙන්නේය. අපගේ දැක්ම පූර්ණ කරීමට උන්වහන්සේගේ දර්ශනය මොනතරම් ද .. ? ස්වභාවික ප්‍රතිඵලයක් වශයෙන් අපගේ හදවත් තුළ නිර්භීතකම, විශ්වාසය සහ සහතිකය හටගනියි. අපි ආත්මයෙන් ජයග්‍රාහී වන විට සටන ආරම්භ කිරීමට පෙර ජයගනු ලබන අතර උන්වහන්සේගේ ඵල ප්‍රකාශවීම වැළැක්විය නොහැකිය.

තමන් තුළටම යටහත් වෙන්න

දෙවනුව, කැඩීගිය අත්තක් වුවත් ස්වාමීන් වහන්සේට සම්බන්ධවීමට කැමැත්තක් තිබිය යුතුය. මක්නිසාද අත්තකට ස්වාධීන තමන්ගේම ජීවිතයක් නොමැත. එයට හැකිවන්නේ මිදිවැල තුළ ඵලදැරීමට පමණි. එබැවින් ස්වාමීන් වන යේසුස් වහන්සේ සමඟ ඇති අපගේ සම්බන්ධතාවයේදී එය අප සමඟ පවතින්නේය. අපගේ ආත්මාර්ථකාමීත්වය සහ පුද්ගලික අවශ්‍යතා සමඟ අපගේ හදවත් තුළ කොයිතරම් සටනක් තිබේද ... ? බොහෝවිට අපව උන්වහන්සේට හිමිකර ගැනීමට (අයිතිකර ගැනීමට) නොහැකිව තිබේ. මක්නිසාද අපි අපගේ පැරණි මධ්‍යස්ථානය වන තම කැමැත්ත වෙතට ආපසු හැරීගොස් තිබේ. නමුත් අපි උන්වහන්සේට සම්බන්ධව තිබෙන්නා වූ අත්තක්වීමට උන්වහන්සේට යටත්විය යුතුය. ඒ වාගේම අපට කැපකිරීමේ බැරෑරුම් මොහොතක කළ හැකි එක් පුළුල් යටත්වීමකින් පමණක් නොව, කාරණාවලට මුහුණදෙන විට සහ උන්වහන්සේ සමඟ කටයුතු කරන විට තමාට සහ තම කැමැත්තට, තම අයිතිවාසිකම්වලට අඛණ්ඩව මරණයට පත්වීමත් ඇතුළත්ව තිබේ. ස්වාමීන් වන යේසුස් වහන්සේට අත්තක් මත ඵල ඇති කළ හැකි වන්නේ එවිට පමණි.

සාක්ෂි සහිත කාරණයකින් මෙම කාරණය පැහැදිලි කරගනිමු. එක් ලේඛකයෙක් රැස්වීම් කිහිපයක් සඳහා දුම්රියෙන් ගමන් කරමින් සිටියේය. ඔහුගේ ගමනාන්තයට ළඟාවීමට පෙර ඔහුට තුන් වරක් දුම්රිය මාරු කිරීමට සිදු විය. ගමනේ පළමු කොටස් දී ඔහු තම පුවත්පතේ කාර්යයන්වල තදින් යෙදී සිටියේය. දුම්රිය මැදිරියේ සිටින අනිත් අය කෙරෙහි අවධානය යොමු කරන ලෙස ඔහුගේ හදවතට සියුම් හඬක් ඇසුණත් ඔහු තම පුවත්පතේ කාර්යයන් පසෙකට දැමීමට අකමැති විය. ඔහුව මිදිවැලට සම්බන්ධ කර ගැනීමට නොහැකි විය. ඔහුගේ දුම්රිය ගමනේ දෙවෙනි කොටසේ දී ඔහු රැස්වීමේ දී දේශනා කිරීමට නියමිත පණිවිඩය සකස් කිරීමේ නිරත විය. නැවතත් සියුම් හඬ ඔහුගේ හදවතට පැවසුවේ තමා වටා සිටින අනිත් අය කෙරෙහි අවධානය යොමු කිරීමේ හදවතක් තිබිය යුතු බවයි. නමුත් ඔහු ඉදිරියේ ඇති රැස්වීම ගැන කණස්සල්ලෙන් හා නොඉවසිලිමත්ව සිටි අතර තමාගේ කාර්යයන් දිගටම කරගෙන යා යුතු බව ඔහුට හැඟුණි. නැවතත් අත්තක් ලෙස මිදිවැලට ඔහුව සම්බන්ධ කරගත නොහැකි විය. නමුත් ඔහුගේ ගමනේ තුන්වෙනි කොටසට ළඟාවන විට ස්වාමීන් වහන්සේ ඔහුව බිඳ දැමූ (හැසිරවූ) අතර අවසානයේ දී ඔහු ස්වාමීන් වහන්සේ සහ මිදිවැල වන යේසුස් වහන්සේගේ අත්තක්වීමට කැමති විය.

7 පිටුවට

“මිදිවැලි මමය, නුඹලා අතුය. යමෙක් මා තුළෙහි පවතින්නේද, මම ඔහු තුළෙහි පවතිමිද, ඒ තැනැත්තේ බොහෝ ඵලදරයි....., (යොහාන් 15.5)

6 පිටුවෙන් යේසුස් වහන්සේ සැබෑ...

දැන් ඔහු ඇතුල්වී සිටි දුම්රිය මැදිරිය හිස්ව තිබූ අතර දෙවියන් වහන්සේ ඇත්තටම ඔහුට කථා කළාද කියා ඔහු කල්පනා කළේය. ඉතා ඉක්මනින් මනුෂ්‍යයෙක් එම මැදිරියට ඇතුල් වූ අතර ගමන අවසන් වන තුරු ඔවුන් දෙදෙනා පමණක් එම දුම්රිය මැදිරියේ සිටියහ. ඔවුන් දෙදෙනා අතරේ ආරම්භ වූ සංවාදය ඉතා ඉක්මනින් ආත්මික දේවල් වෙත සහ ස්වාමීන් වහන්සේව මනුෂ්‍යයාට අවශ්‍ය වන්නේ ඇයි යන සාකච්ඡාවට යොමු විය. ගමනාන්තයට පැමිණීමට විනාඩි කිහිපයකට පෙර එම පුද්ගලයා දුම්රියේදීම ක්‍රිස්තුස් වහන්සේව තම පුද්ගලික ගැලවුම්කරුවාණන් ලෙස පිළිගනු ලැබීය. එතැනින් පසු මෙම ලේඛකයාට දුම්රියේ දී හමුවූ මනුෂ්‍යයා එවූ ලිපි වලින් ඔහු දෙවියන් වහන්සේ තුළ සිටින බවට සාක්ෂි ලැබුණි.

ලේඛකයාට එම අත්දැකීමට තම ස්වාමීන් වහන්සේ පිළිබඳව නැවුම් අත්දැකීමක් ලබා දුන්නේය. ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි නව විශ්වාසයක් ඔහුගේ හදවතේ ඇති වූ අතර කලින් කලාතුරකින් ස්වාමීන් වහන්සේ වන යේසුස් වහන්සේ සභාවට පිබිදීම සහ ගැලවීම ගේනවා දැක තිබූ නුමුත් දැන් උන්වහන්සේගේ පිබිදීම සහ ගැලවීම නිතර අත්දුටුවේය. මෙම අශිවාර්වාදලත් මිදිවැල අනුකම්පා සහගත වන අතර මනුෂ්‍යයන්ගේ අවශ්‍යතා ගැන සැලකිලිමත් වේ. නමුත් අපි නොසැලකිලිමත් සහ ආත්මාර්ථකාමී වන්නෙමු. මෙම මිදිවැල මනුෂ්‍යයන්ට ප්‍රේමකිරීමේ උන්වහන්සේගේම අරමුණු ක්‍රියාත්මක කිරීමට තේජාන්විතව ප්‍රමාණවත්ය. නමුත් අපි විශ්වාස නොකිරීම කරුණුකොටගෙන මිදිවැලට ඇති සම්බන්ධතාවය බිඳගෙන ඇත්තෙමු. දෙවියන් වහන්සේ අප සමඟ කටයුතු කර අපව හසුරවන සේක්වා. එවිට අපි උන්වහන්සේගේ අතු ලෙස උන්වහන්සේට සම්බන්ධවීමට කැමැත්තෙන් සිටින්නෙමු.

ක්‍රිස්තුස් වහන්සේ තුළ රැඳී සිටින්න

මෙම ජීවිතයේ අපගේ කොටස විස්තර කිරීමට ස්වාමීන් වහන්සේ වන යේසුස් ක්‍රිස්තුස් වහන්සේ භාවිතා කළ ප්‍රකාශයේ තේරුම සලකා බැලීමට දැන් අපට හැකිය. උන්වහන්සේ මෙසේ පැවසූ සේක. **“මා තුළ පැවතියල්ලා. මවත් නුඹලා තුළ පවත්නෙව්. අත්න විදිවැලෙහි නොපවතී නම් තනියම වල දාන්ට බැහැවාක් වෙන් නුඹලා මා තුලෙහි නොපවතිවු නම් වලදාන්ට නුඹලාට බැරිය”.** (යොහාන් 15:4) අපි මෙම අංගය අවසානය දක්වාම තබා ගැනීම යහපත්ය. මන්ද එය මනුෂ්‍යයන්ගේ විනාශවෙන ආත්මයන් සොයන සිතුවිල්ල තුළ විශාල ලෙස මතුවී ඇත. සමහර විට රහස තිබෙන්නේ පැවැත්ම තුළ යැයි පවසා ඇත. නමුත් එය එසේ නොවේ. මන්ද එය අප පහකරන යම් කාරණාවල රහස රැඳී ඇති බැවිනි. මෙය තවත් ආකාරයක උත්සාහයකට මඟපෑදිය හැකිය. රහස නිසැකවම මිදිවැල තුළ රැඳී ඇති අතර ආශිර්වාදය ලැබෙන්නේ අපි උන්වහන්සේව එලෙස දැකීමෙන්ය. අපි උන්වහන්සේව දකින විට අපි එය දැන ගැනීමට පෙර උන්වහන්සේ තුළ රැඳී පවතින්නෙමු.

“පැවැත්ම” යන වචනයේ සරල තේරුම, “වාසය කිරීම”, “රැඳී සිටීම” හෝ “ඉදිරියට යාම” යන්නයි. දෙවියන් වහන්සේ අපව උන්වහන්සේගේ පුත්‍රයාණන් තුළ තබා ඇත. මිදිවැලට අත්තක් මෙන් අපව උන්වහන්සේට එක්සත් කර ඇත. අපි උන්වහන්සේ තුළ රැඳී සිටිමු. වාසය කරමින් නොකඩවා එහි පවතිමු. අපි මෙය කළහොත් උන්වහන්සේ අප තුළ වාසය කිරීමට. රැඳී සිටීමට, පැවතීමට පොරොන්දු වී තිබෙන සේක. “මා තුළ පැවතියල්ලා” යනු අපි සම්පූර්ණ කළ යුතු කොන්දේසියයි. එවිට “මමත් නුඹලා තුළ පවතින්නෙමි” යනු උන්වහන්සේගේ පොරොන්දුවයි. උන්වහන්සේ නැවත උන්වහන්සේගේ ජීවිතය අප තුළ ජීවත් කරවන විට උන්වහන්සේගේ ඵල සහ ජයග්‍රහණය ප්‍රකාශ විය යුතුය. මක්නිසාද උන්වහන්සේ කිසි විටෙකත් අසාර්ථක නොවේ. එසේ නම් ක්‍රිස්තුස් වහන්සේ තුළ රැඳී සිටීම යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද ... ? මිදිවැල වන යේසුස් වහන්සේ ගැන අපට පවසා ඇති සියල්ලේ ආලෝකයෙන් වචනය අර්ථ නිරූපණය කළ යුතුය. එය මුලින්ම සමන්විත වන්නේ පාපය පැමිණෙන සෑම අවස්ථාවක්ම ඉක්මනින් පසුතැවිලිවීමට කැමැත්තක් දැක්වීම තුළිනි. මක්නිසාද පසුතැවිලිවීම අපව නැවතත් අතු ලෙස අපගේ නිවැරදි ස්ථානයේ තබයි.

දෙවනුව, එයින් අදහස් කරන්නේ යේසුස් වහන්සේව මිදිවැල ලෙසත්, අපව අතු ලෙසත් නිරන්තරයෙන් දැකීමයි. එමෙන්ම උන්වහන්සේගේ අසීමිත සම්පත්වල බලයෙන් අන් අය වෙනුවෙන් ජීවත්වන සහ ක්‍රියාකරන අතු ලෙසත්ය. ප්‍රතිඵලය වන්නේ මෙම අතිවිශිෂ්ඨ මිදිවැල සමඟ ඇති එකමුතුකම මත අඛණ්ඩව ගණන් ගන්නා ඇදහිල්ලකි. එවැනි ඇදහිල්ලක් උන්වහන්සේට එක්සත්වීමට ඉල්ලා නොසිටින නමුත් එය දැනටමත් එක්සත්වී ඇති බවේ ස්ථාවරය ගන්නා අතර උන්වහන්සේගේ ජීවිතය අපගේ කරගැනීම සඳහා උන්වහන්සේට ප්‍රශංසා කරයි. එමෙන්ම අන් අයට ආශිර්වාද කිරීම උන්වහන්සේට, උන්වහන්සේගේ අතු ලෙස ප්‍රයෝජනයට ගත හැකි වන පරිදි එහි අයිතිවාසිකම් සහ අවශ්‍යතා අඛණ්ඩව යේසුස් වහන්සේට ලබාදෙන තත්ත්වයට පැමිණේ.

අවසාන වශයෙන් පැවැත්ම ප්‍රේමය ප්‍රකාශ කරයි. වචනයෙන් පමණක් නොව ක්‍රියාවෙන්ද අන් අය වෙතට වගුරුවන ප්‍රේමය වත්කිරීමට අපි ආරම්භ කරන විට ක්‍රිස්තුස් වහන්සේ, උන්වහන්සේගේ ප්‍රේමය වගුරුවනු ලබන සේක. නමුත් අපි ප්‍රේමය වත්කිරීමට පටන් නොගන්නේ නම් උන්වහන්සේට එය වැගිරවිය නොහැකිය. ප්‍රේමයේ මෙම පිටතට ගලායාම සහ අන්‍යෝන්‍යභාවය ඇතත් වශයෙන්ම යොහාන් 15 වන පරිච්ඡේදයේ යේසුස් වහන්සේ මත රැඳී සිටීම පිළිබඳව ලබාදෙන එකම දැක්වීම වන අතර එම නිසා අනෙක් සෑම කොටසක්ම ඇතුළත් විය යුතුය. උන්වහන්සේ මෙසේ පැවසූ සේක. **“මව වාගේ පියාණන් වහන්සේගේ ආඥා rක්ෂාකොට උන්වහන්සේගේ ප්‍රේමයෙහි යව් සේ පවතිව්ද, එසේම නුඹලාත් වාගේ ආඥා rක්ෂා කරවුනව් වාගේ ප්‍රේමයෙහි පවතින්නාහුය.” (යොහාන් 15:10) “වාගේ ආඥාව නව්, මා නුඹළාට ප්‍රේම කළාක් මෙන් නුඹලාත් එකිනෙකාට ප්‍රේම කරපල්ලා යනුය. ”** (යොහාන් 15:12)

කෙසේ වෙතත්, අපි මෙයින් කිසිදු සූත්‍රයක් සාදා නොගනිමු. පළමුවත්, දෙවනුවත්, තුන්වෙනුවත්, යේසුස් වහන්සේ මිදිවැල ලෙසත් අපි උන්වහන්සේගේ කොටසක් ලෙසත්, දැකීම සහ අන් අය සඳහා උන්වහන්සේ එනම් මෙම අපූරු, ජීවමාන, කරුණාවන්ත මිදිවැල අපව නැවතත් උන්වහන්සේගේ ජීවිතය කරගනු ඇත. මනුෂ්‍යයන් උදෙසා තමන්ගේම ඵල උපදවමින් සහ ඔවුන් වෙනුවෙන් ආශ්චර්යයන් අප තුළ සහ අප තුලින් කරනු ලබන සේක.

පසුගිය කලාපයෙන්

උදුන වඩාත් රත් වූ විට ඔබ කරන්නේ කුමක්ද.. ?

ඇදහිල්ල දෙවියන් වහන්සේගේ පොරොන්දු මත පමණක් නොව උන්වහන්සේගේ පුද්ගලිකත්වය මත ද පදනම්ව තිබේ. දෙවියන් වහන්සේ පිළිබඳ දැනුම සමඟ ඇදහිල්ල වර්ධනය වේ. දෙවියන් වහන්සේ තමන් තුළ සිටින බව දැන සිටින්නා වූ තැනැත්තාගේ සාමාන්‍ය ප්‍රතිචාරය ඇදහිල්ලයි.

උත්පත්ති 17 වන පරිච්ඡේදයේ දී දෙවියන් වහන්සේ ආබ්‍රහම්ව දර්ශනය වූ විට උන්වහන්සේ ඔහුට පොරොන්දු කිහිපයක් දුන් සේක. නමුත් උන්වහන්සේ ආබ්‍රහම්ට පොරොන්දුවේ කැමැත්ත දීමට පෙර ආබ්‍රහම් තුළ සහ ආබ්‍රහම් තුළින් කිරීමට පොරොන්දු වූ සියල්ල සඳහා තමන් වහන්සේ ප්‍රමාණවත් බව ආබ්‍රහම්ට පැවසූ සේක. (**“මම සර්ව පරාක්‍රම වූ දෙවියන් වහන්සේය.”**)

දෙවියන් වහන්සේගේ වචනයේ උන්වහන්සේ අපට ලබා දී තිබෙන සියලු පොරොන්දු ගැන අපි උන්වහන්සේට ස්තුති කළ යුතුය. රෝගීන් වෙනුවෙන් යාච්ඤා කළ යුතු අතර සුවය සඳහා දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසය තැබිය යුතුය. අපගේ සියලු අවශ්‍යතා සපුරාලන බවට දෙවියන් වහන්සේ කෙරෙහි අපගේ මුළු හදවතින්ම විශ්වාස කළ යුතුය. කෙසේ වෙතත් සුවය නොලැබුණවිටදීත් අපගේ යාච්ඤාවලට අපි අපේක්ෂා කරන පිළිතුර නොලැබුණවිටදීත් අපගේ ආකල්පය දානියෙල් තුන්වන පරිච්ඡේදයේ සඳහන් යුදෙව් තරුණයන් වන ෂදුක්, මේෂක්, අබේද්නෙගෝ නෙබක්දනේශර් රජුට කළ ප්‍රකාශය මෙන් විය යුතුය. **“ඇවිලෙන ගිනි උඳුනෙන් ගලවන්ට නම් අප සේවය කරන අපේ දෙවියන් වහන්සේට පුළුවන. rජ්ජුරුවෙනි, උන්වහන්සේ ඔබගේ අතින් අප ගලවන සේක. එසේ නොකලත් rජ්ජුරුවෙනි, ඔබගේ දෙවිවරුන්ට අප සේවය කරන්නේවත් ඔබ පිහිටුවා තිබෙන rන් rපයට නමස්කාර කරන්නේවත් නැති බව දැනගත මැනවැයි කීවෝය. ”** (දානියෙල් 3:17-18)

ඔවුන්ගේ කැපවීම දෙවියන් වහන්සේ කෙරෙහි වූ අතර, ඔවුන් උන්වහන්සේ ස්වාධිපත්‍යය ඇතිව හරිදේ සහ යහපත් දේ කරන බව පිළිගනිමින් කුමක් සිදුවුවද උන්වහන්සේ කෙරෙහි විශ්වාස කිරීමට කැමැත්තෙන් සිටියෝය. ඔවුන් දෙවියන් වහන්සේ සහ උන්වහන්සේගේ ගැලවීම සොයාගත්තේ ගිණි උඳුන තුළදීය. ඔවුන්ගේ ඇදහිල්ලේ ප්‍රතිඵලයක් ලෙස අහක්තික මනුෂ්‍යයන් ඉදිරියේ දෙවියන් වහන්සේගේ නාමය ගෞරවයට පත්විය. යහපත් කාලවලදී සහ දුෂ්කර කාලවලදී තමන් කෙරෙහි විශ්වාසය තබන අය ගැන දෙවියන් වහන්සේ සතුටුවන සේක. උන්වහන්සේ ඔවුන්ට තමන්ව හඳුන්වා දෙන අතර ඔවුන් තුලින් මහිමයට පත්වන සේක. අනිත් අය බියෙන් ගොලායත් යෝධයාව දැක පලායන අතර දාවිත්ට ගොලායත්ට මුහුණ දීමට හැකිවූයේ කෙසේද ..? වෙනස වූයේ ඔහු ඒ දෙස බැලූ ආකාරයයි. අනිත් අය තමන්ව ගොලායත්ව තමන් සමඟ සන්සන්දනය කළෝය. දාවිත් ගොලායත්ව දුටුවේ දෙවියන් වහන්සේගේ විශ්වාසවන්තභාවයට, උන්වහන්සේගේ බලයට, දෙවියන් වහන්සේගේ ස්වභාවයට විරුද්ධ වූ අයෙකු ලෙසයි. අනිත් අය තමන්ගේම ආරක්ෂාව ගැන සැලකිලිමත් වූ අතර දාවිත්ගේ මූලික සැලකිල්ල වූයේ දෙවියන් වහන්සේගේ මහිමය සඳහාය. දාවිත් ගොලායත්ට මුහුණ දෙන විට ඔහු උඩඟු වූයේ නැත. ඔහු දෙවියන් වහන්සේ ඉදිරියේ බොහෝ වේලාවක් තනිවම ගතකර තිබූ අතර ඔහු දෙවියන් වහන්සේගේ බලයද අත්විඳ තිබුණේය.

යේසුස් වහන්සේ කුරුසියේ එල්ලී සිටන විට උන්වහන්සේ මෙසේ මොරගැසූ සේක. “... මාගේ දෙවියනි ..., මාගේ දෙවියනි...., ඔබ මා අත්හැරියේ මක්නිසාද?” උන්වහන්සේ අප වෙනුවෙන් දුක්වින්දේ අපට කිසිදාක පියාණන් වහන්සේගෙන් වෙන්වීමක් අත්විඳීමට අවශ්‍යය නොවන පිණිසය. උදුන කොයිතරම් උණුසුම් වුවද, මම කිසිදා ඔබව අත්නොහරිම් යැයි පැවසූ උන්වහන්සේ අප සමඟ සිටින බව අපට දැකගත හැකිය. දෙවියන් වහන්සේ අප සමඟ සිටින බව අපට දැකගත හැකිය. දෙවියන් වහන්සේ සහ උන්වහන්සේගේ අරමුණු නොවෙනස්ව පවතින බැවින් අපි කිසිදා නොවූ තරම් පිරිසිදු හා ශක්තිමත් ලෙස ඉදිරියට යන්නෙමු. **“යේසුස් වහන්සේ ඔවුන්ට උත්තර දෙවින් දෙවියන් වහන්සේ කෙරෙහි ඇදහිල්ල ඇතුව සිටපල්ලා. සැබෑවක් නුඹලාට කියමි. කවරෙක් නමුත් මේ කන්දට කථාකොට ඉඳිරි මුහුදේ වැටියන්නැයි කියා තමන්ගේ සිතින් සැක නොකොට තමා කියන දේ සිදුවේ යැයි අදහන්නේ නම් ඒක ඔහුට සිදුවන්නේය.”** (මාරක් 11:22-23)

“දොරකඩ නම් මමය. යමෙක් මා කරුණුකොටගෙන ඇතුල්වේද, ඔහු ආරක්ෂා කරනු ලැබ ඇතුළට සහ පිටතට ගොස් ගොඳුරු ලබන්නේය. ” (යොහාන් 10:9)

Reg. No: Dop/News/33/2025
30/7,0A චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව.

ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රේමය දැන ගැනීම

(ආතර් ඩබ්. පින්ක් විසිනි)

"දෙවියන් වහන්සේගේ පුළුළු පූර්ණකමට පූර්ණවන පිණිස සියලු ශුද්ධවන්තයන් සමඟ ක්‍රිස්තුස් වහන්සේගේ දැනගත නොහැකි ප්‍රේමය දැනගෙන එහි පළල, දිග, උස, ගැඹුර කිමෙක්ද කියා තේරුම් ගන්නට නුඹලාට පුළුවන් වන පිණිසත්, උන්වහන්සේගේ මහිමයේ සම්පතේ හැටියට නුඹලාට දෙන මෙන් යාච්ඤා කරමි." (එපීස 3:18-19)

ඇදහිලිවන්තයාගේ අධ්‍යාත්මික ජීවිතයේ පෝෂණය , සෞඛ්‍යය, ඵලදායිතාවය සඳහා ඔහු නිරන්තරයෙන්ම ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රේමය මත නියැලී සිටීම (රැඳී සිටීම) අත්‍යාවශ්‍යවේ. උන්වහන්සේගේ ප්‍රේමයේ ගැඹුරුට පතුලක් නැති වෙරළක් නැති (සීමාවක් නැති) මුහුදක් මෙන්ය. අපට ප්‍රේම කරන්නා වූ යේසුස් වහන්සේ මෙසේ පැවසූ සේක. **"පියාණන් වහන්සේ මට ප්‍රේම කළාක් මෙන්ම, මමත් නුඹලාට ප්‍රේම කළෙමි. මාගේ ප්‍රේමයේහි පැවතියල්ලා "** (යොහාන් 15:9) එවැනි ප්‍රේමයක් අපට ප්‍රකාශ කිරීමට හෝ සිතීමට නොහැකිය. එහෙත් අපගේ හදවත් නිරන්තරයෙන් එම ප්‍රේමය වෙත යොමු කර දවස්පතා එය පානය කළ යුතුය.

යොහාන් 15:9 වන පදයේ සඳහන් පරිදි පියාණන් වහන්සේ සාදකාලිකවම යේසුස් වහන්සේට ප්‍රේමකරන්නාක් මෙන් යේසුස් වහන්සේ ඔවුන්ට ප්‍රේම කරන සේක. ප්‍රීතියෙන් විශේෂ සෙනෙහසකින් වෙනස් නොවන ස්ථිරසාර සදාකාලික ප්‍රේමයකින් ක්‍රිස්තුස් වහන්සේ උන්වහන්සේගේ සභාවට ප්‍රේම කරන සේක. උන්වහන්සේගේ සිත සෑම විටම උන්වහන්සේගේ මනමාලිය වෙත යොමු කර තිබෙන සේක. යේසුස් වහන්සේ සභාවට ප්‍රේම කළේ පියාණන් වහන්සේ, උන්වහන්සේට දුන්නා වූ ප්‍රේමයේ තෑග්ගක් ලෙසින්ය. උන්වහන්සේ සභාවට ප්‍රේම කළේ පියාණන් වහන්සේ විසින් සභාවට පිරිනැමූ ඇගේ සියලු අලංකාරයෙන් , තේජසින් සහ විශිෂ්ටත්වයෙන් ඇය සදාකාලයටම උන්වහන්සේගේ මනමාලිය වී තේජසේ රාජ්‍යය තුළ බැබළෙන්නට නියමිත නිසාය. උන්වහන්සේ ඇයට ප්‍රේම කළේ උන්වහන්සේගේ සියලු මහිමය ප්‍රකාශ කිරීමට සුදුසු වූ උන්වහන්සේගේ අදෘශ්‍යමාන ශරීරය ලෙසය. උන්වහන්සේගේ අද්විතීය වස්තුව ලෙස සභාවට ප්‍රේම කරන සේක. (නික්මයාම 19:5) උන්වහන්සේගේම වස්තුව ලෙස උන්වහන්සේ ඇගේ ජීවිතය, ඇගේ ආලෝකය, ඇගේ ශුද්ධකම, ඇගේ ධර්මිෂ්ඨකම, ඇගේ පරිපූර්ණත්වය සහ මහිමය විය යුතුය. මක්නිසාද උන්වහන්සේ ඇගේ සියල්ල ඇගේ සදාකාලික හිස සහ ඇගේ ස්වාමියා ලෙස පිළිගත යුතුය. ක්‍රිස්තුස් වහන්සේ තම සභාවට දක්වන ප්‍රේමයේ ආරම්භය, පැවැත්ම, උසස් සහ තේරුම්ගත නොහැකිය. උන්වහන්සේගේ ප්‍රේමය ආරම්භ වූයේ පියාණන් වහන්සේ, දිව්‍යමය මනුෂ්‍යයා ලෙස උන්වහන්සේට ප්‍රේම කිරීමටත්. උන්වහන්සේගේ භාර්‍යාව ලෙස ඇදිහිලිවන්තයාව තෝරා ගැනීමත්, ඔවුන්ට ප්‍රේම කිරීමත්, අලංකාර කිරීමත්, පුත්‍රයාණන් වහන්සේට ඇයව පරවාදීමත් මත ඇති සදාකාලික ප්‍රේමය තුළ වන සේක.

දිව්‍යමය ප්‍රේමය සහ මහිමය

ක්‍රිස්තුස් වහන්සේ තම සෙනඟ කෙරෙහි දක්වන ප්‍රේමය සහ ඔවුන් කෙරෙහි ඇති උන්වහන්සේගේ හැඟීම සියලුම සංකල්ප අභිබවා යන්නේය. උන්වහන්සේගේ දිව්‍යමය වූ පුද්ගලිකත්වය, උන්වහන්සේගේ ප්‍රේමය මත සදාකාලික පරිපූර්ණත්වය මුද්‍රා කර ඇති අතර උන්වහන්සේගේ සියලු මැදහත්කාර ක්‍රියාවන් මත සදාකාලික වටිනාකම, ගුණවත්කම, කාර්‍යක්ෂමතාවය මුද්‍රාකර තිබේ. ජීවමාන දෙවියන් වහන්සේගේ පුත්‍රයා වන උන්වහන්සේ ලෝකය ආරම්භ කිරීමට පෙර සභාවට ප්‍රේම කරන ලද සභාව තෝරාගත් , පිළිගනු ලැබූ තැනැන්වහන්සේ වන සේක. උන්වහන්සේගේ සියලු ගෞරවයන්, පදවිනාම, තේජස, බෙදා ගැනීමටත්, උන්වහන්සේගේ සියලු කරුණාවේ මහිමය අනිත් සියල්ලන් සමඟ බෙදා ගැනීමටත්, උන්වහන්සේගේ සෙනඟව දිව්‍යමය ලෙස පත්කරන ලදි. ක්‍රිස්තුස් වහන්සේ මුදාගනු ලැබූ අය උන්වහන්සේ සමඟ ස්වර්ගයේ ජීවත්වී, උන්වහන්සේගේ තේජසින් උන්වහන්සේව දැකීමට සහ උන්වහන්සේ සිටින ආකාරයටම උන්වහන්සේව දැකීමෙන් සතුටින් පූර්ණවීම හැර ක්‍රිස්තුස් වහන්සේගේ හදවත තෘප්තිමත් කිරීමට හැකි වෙන කිසිවක් නැත. උන්වහන්සේගේ ප්‍රේමයේ අඩංගු සියල්ල ශුද්ධවන්තයන් වන උන්වහන්සේගේ සෙනඟ කිසිවිටෙකත් වටහානොගනු ඇත. උන්වහන්සේගේ මාංශවත්වීමෙන්, උන්වහන්සේගේ කීකරුකමෙන්, උන්වහන්සේගේ දුක්විඳීමෙන් ප්‍රකාශ වූ දේ ශුද්ධවන්තයන්ට අගේ කළ හැකි ප්‍රමාණයට වඩා බොහෝ සෙයින් වැඩිය. එය දැන ගැනීමට, විශ්වාස කිරීමට සහ එය භුක්තිවිඳීමට අපව ගෙන ඒම ගැඹුරු කෘතඥතාවයට හේතුවක් වේ.

එබැවින් ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රේමය අති විශිෂ්ට අභිරහස්, අසීමිත සහ තේරුම්ගත නොහැකි බැවින් එය අපට තේරුම්ගත හැකි වන්නේ කෙසේද ... ? සම්පූර්ණයෙන්ම හා පරිපූර්ණ ලෙස එය කළ නොහැකිය. නමුත් එයින් සැබවින්ම තෘප්තිමත් විය හැකිය. ක්‍රිස්තුස් වහන්සේ අප කෙරෙහි ඇති ප්‍රේමය සත්‍ය වූ වචනයෙන් සොයාගත හැකිය. ශුද්ධාත්මයාණන් වහන්සේ අපගේ අවබෝධය ආලෝකවත් කරන විට ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රේමයේ ඇති අරුම පුදුම දේ සහ ආශිර්වාදය ග්‍රහණය කර ගැනීමට අපට හැකියාව ලැබේ.

උන්වහන්සේගේ ප්‍රේමයෙන් ඔබගේ ජීවිතය හැඩගැස්වීමට ඉඩ දෙන්න.

කිතුණුවන්ගේ ප්‍රධාන අධ්‍යාත්මික කාර්යභාරය විය යුත්තේ ක්‍රිස්තුස් වහන්සේගේ පුදුමාකාර ප්‍රේමය ගැන මෙනෙහි කරමින් සහ අගේ කරමින් ජීවත්වීමත්, තමාගේ හදවත උණුසුම් වන තුරු, තමාගේ ආත්මය ප්‍රශංසාවෙන් උතුරා යන තුරු තමාගේ මුළු ජීවිතයම බලපෑමට ලක්වන තුරු, තමාගේ සිතුවිලි තුළ ඒ ගැන සිතීමයි. ඔහු එහි ලක්ෂණ ගැන දිනපතා මෙනෙහි කළ යුතුය. එහි නිදහස් බව, පාරිශුද්ධ බව, උද්යෝගී බව, වෙනස් නොවන බව මෙනෙහි කළ යුතුය. අපි අපගේ ජීවිතවලට ප්‍රේම කරනවාට වඩා ක්‍රිස්තුස් වහන්සේ අපට ප්‍රේමකරන සේක. අපි උන්වහන්සේට වෛර කළත්, උන්වහන්සේ අපට ප්‍රේම කළ සේක. උන්වහන්සේ අප කෙරෙහි ඇති ප්‍රේමය වෙනස් කිරීමට කිසිවකට නොහැකිය. උන්වහන්සේගේ ප්‍රේමය ප්‍රකාශ වන ආකාරය අපි මෙනෙහි කළ යුතුය. පළමුව සාදාකාලික ගිවිසුම තුළ පියාණන් වහන්සේගේ යෝජනා පිළිගැනීමෙන් ප්‍රේමය ප්‍රකාශ කළ සේක. උන්වහන්සේ තම වැටුණු සෙනඟගේ අනුග්‍රාහකයාවීමට සහ ඔවුන්ගේ ඇපකරු ලෙස සේවය කිරීමට නිදහසේ කැමැත්ත පලකළ සේක. ඉන්පසු එම කටයුතු සැබවින්ම ඉටුකිරීමේදී විස්තර කළ නොහැකි ස්වර්ගීය සැප සම්පත් අත්හැර පාපයෙන්, ව්‍යාකූලත්වයෙන් සහ දුක් වේදනා වලින් පිරුණා වූ පොළොවට පැමිණි ආකාරය බලන්න. උන්වහන්සේගේ ප්‍රේමය කෙබඳුද .. ?

දේවදූතයන්ට වඩා පහත් ස්වභාවයක් තමන් කෙරෙහි ගැනීමට සතුටු වූ ජෙහෝවාගේ යටහත්කම දෙස බලන්න. වචනය මාංශවත් වූ විට උන්වහන්සේගේ දිව්‍ය මහිමය සම්පූර්ණයෙන්ම පාහේ යටපත් විය. දෙවියන් වහන්සේගේ පුත්‍රයා පහලට පැමිණ දරාගත් කිව නොහැකි නින්දාව ගැන මෙනෙහි කර බලන්න. ස්වර්ගයේ සිංහාසනය සහ බෙත්ලෙහෙමේ ගව ඔරුව අතර ඇති දුර සහතික කළ විට පමණක් එහි නින්දාව අපට මැනිය හැකිය. මාංශවත් වූ තැනැන් වහන්සේ ලෙස වුවද උන්වහන්සේ තමන්වම කීර්තිමත් බවට පත්කර නොගත් බවත් තේජසින් ප්‍රකාශ වී පෙනී සිටීම වෙනුවට දාසයෙකුගේ ස්වරූපය ගත් බවත් මතක තබාගන්න. **"ක්‍රිස්තුස් යේසුස් වහන්සේ තුළ තිබුණු සිතිවු නුඹලා තුළත් තිබේවා. උන්වහන්සේ දෙවියන් වහන්සේගේ bපාකාර්ය දර්ශ සේක්. දේවියන් වහන්සේට සමානව සිටීම තමන් විසින් අල්ලාගෙ නම සිටිය යුතු වස්තුවකැයි නොසිතා එය ඉවත් කර දාසයෙකුගේ ස්වරූපය ගෙන, මනුෂ්‍යයන්ගේ සමානත්වයට පැවිණි සේක."** (පිලිප්පි 2:5-7) උන්වහන්සේ සේවය ලැබීමට නොව සේවය කිරීමට පැමිණි සේක. අපකීර්තිය නොසලකා යටහත් වූ සේක. උන්වහන්සේගේ මිත්‍රයන් ලෙස සැලකූ අයගෙන් උන්වහන්සේට කුමන ආකාරයේ ප්‍රතිචාරයක් ලැබෙයිද කියා උන්වහන්සේ දැන සිටි සේක. උන්වහන්සේ පිළිගැනීම, ප්‍රේම කිරීම, උන්වහන්සේව අගේ කිරීම, නමස්කාර කිරීම වෙනුවට මනුෂ්‍යයන් විසින් උන්වහන්සේව හෙළා දකින බවත්. ප්‍රතික්ෂේප කරන බවත් උන්වහන්සේ දැන සිටි සේක. උන්වහන්සේ යහපත කරමින්, රෝග සුව කරමින් අසරණයන්ට සහනය ලබාදෙමින්, දිළිඳුන්ට සුභාරංචිය දේශනා කරමින් ඇවිද ගියද ආගමික නායකයන් විසින් උන්වහන්සේට පීඩාකරන බවත්, හේතුවක් නොමැතිව වෛර කරන බවත්. වරදවා වටහාගෙන අවසානයේ දී උන්වහන්සේගේම ගෝලයන් විසින් පවා උන්වහන්සේව අතහැර දමන බවත් යේසුස් වහන්සේ දැන සිටි සේක. එය මොනතරම් උතුම් වූ ප්‍රේමයක් ද ..? ඇත්ත වශයෙන්ම දැනුම ඉක්මවා ගිය ප්‍රේමය මෙයයි. අපගේ හදවත් නිරන්තරයෙන් අල්ලාගෙන අපගේ ජීවිත හැඩගස්වා ගත යුතු ප්‍රේමය මෙයයි.

වැදගත් දැන්වීමක්...

පෙරමග දූතයා පත්තරයට කිසිදු විදිහක අයකිරීමක් නොකරන අතර එය නොමිලේ බෙදාහැරේ. දායක මුදලක් මේ පත්‍රයට අය නොකරන නමුත් මෙහි වියදම් සඳහා කිසියම් මුදලක් දීමට පෙළඹීමක් ඇත්නම් එය කෙලින්ම සංස්කාරකට පමණක් එවන්න.

මූලසිට අග දක්වා නිවැරදි දේව වචනය අඩංගු බයිබලය පැහැදිලි කරමින් ක්‍රිස්තුස් වහන්සේ දෙවන පැමිණීමට සෙනඟක් සුදානම් කිරීම පෙරමග දූතයා පත්‍රයෙහි මූලික පරමාර්ථය බැවින් අන්තර් ආගමික හෝ අන්තර් නිකායික වාදවිවාද වලට මෙහි ඉඩ සලසා දෙන්නේ නැත. එහෙත් ඔබගේ ආත්මික ජීවිතයේ යම්කිසි ගැටළුවක් පැන නැගී නම් දේව වචනය අනුව එය විසඳා ගැනීමට අපට ලියා එවන්න. පෙරමග දූතයා පත්‍රයෙන් ඔබට ලැබෙන්නා වූ ආශිර්වාදයන් ලියා එවීම අපට සතුටක් වන අතර දෙවියන් වහන්සේට මහිමය ගෙන දෙන්නකි.

අපගේ උත්සාහය යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සාක්ෂිකරුවන් හැටියට සේවය කිරීමයි. එබැවින් අපට නිකායක් නැත. කිසිම චේතනයක් හෝ වැටුපක් නොලබන අපි මෙම සේවයේ දියුණුව උදෙසා උනන්දුකමින් යාච්ඤා කරන මෙන් ඔබගෙන් ඉල්ලා සිටිමු.

ඔබගේ සියළුම ලිපි, ආධාර මුදල් (චෙක්පත් හෝ මුදල් ඇණවුම්) යාච්ඤා ඉල්ලීම්. සාක්ෂි සහ ඔබගේ ගැටළු මෙසේ එවන්න.

සංස්කාරක:
පෙරමග දූතයා
30/7, චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව

මොරටුව රාවතාවත්තේ පදිංචි ගරු දේවගැති වීරප්පුලිගේ නිස්සංක චෙනුවෙන් කොළඹ 10, ජයන්ත වීරසේකර මාවතේ අංක: 47, දරන ස්ථානයේපිහිටි ස්ටාර් මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.